# 2013

# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT



**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව**
**உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை**
**DEPARTMENT OF INLAND REVENUE - SRI LANKA**

# දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ
# කාර්ය සාධන වාර්තාව

# உள்நாட்டு இறைவரி ஆணையாளரின்
# செயலாற்றுகை அறிக்கை

# PERFORMANCE REPORT
# OF THE
# COMMISSIONER GENERAL OF INLAND REVENUE

# 2013


මල්ලිකා සමරසේකර

**மல்லிகா சமரசேகர**

**Mallika Samarasekara**



දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

உள்நாட்டு இறைவரி திணைக்களம்

DEPARTMENT OF INLAND REVENUE

**2013 වර්ෂය තුළ කාර්ය සාධනයේ සාරාංශය**

2013 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද මුළු ආදායම රුපියල් මිලියන 492,539 ක් වූ අතර, එය පෙර වසරට වඩා 11.07% ක වැඩිවීමක් පෙන්වයි. එය රජයේ මුළු ආදායමට 43.30% ක දායකත්වයක් ලබාදුන් අතර, වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයෙන් 5.85% ක් විය.

බදු අනුකූලතාවය ඉහළ නැංවීම පිණිස පහසුකම් සැලසීම සහ බලාත්මක කිරීම සම්බන්ධ ක්‍රියාමාර්ග ඇතුළුව ඒකාබද්ධ යාන්ත්‍රණයක දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිරතව සිටී.

වාර්තා ඉදිරිපත් කර ඇති ආකාරයෙන් ස්වේච්ඡා අනුකූලතාවය ඉහළ ගොස් ඇති බැවින්, මෙම ප්‍රයත්නයන් සාර්ථක බවට ප්‍රත්‍යක්ෂ වේ. රජයේ ආදායම වෙනුවෙන් ස්වකීය දායකත්වය අගය කිරීම සඳහා බදු ගෙවන්නන් සඳහා වරප්‍රසාද කාඩ්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.

අනෙක් අතට, වර්ෂය තුළ දී, බදු විගණනය නියාමනය කිරීම තුළින් රුපියල් මිලියන 254,654 ක් වූ ප්‍රකාශ නොකළ ආදායම සහ පිරිවැටුම අනාවරණය කරගත හැකි විය. වසර තුළ පනවන ලද අතිරේක බදු ප්‍රමාණය රුපියල් මිලියන 19,669 ක් විය.
පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා, පැහැර හරින ලද බදු අයකර ගැනීමේ පනතට අතිරේක වශයෙන් අදාළ ප්‍රඥප්තිවල නිශ්චිතව දක්වා ඇති පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග සහ පියවර අඛණ්ඩව ගනු ලැබ ඇත.

බදු නීති අර්ථ නිරූපණය සඳහා වන කමිටුව විසින් ඇතැම් නෛතික ව්‍යවස්ථාමය විධිවිධාන සම්බන්ධයෙන් අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපදෙස්වලට අතිරේකව වර්ෂය තුළ අර්ථ නිරූපණ 54 ක් සම්බන්ධයෙන් අර්ථ දැක්වීම් සිදුකරන ලදි.

තොරතුරු අංශය, බදු ගෙවන්නන්ගේ සේවා අංශය සහ ප්‍රාදේශීය කාර්යාල විසින් ගන්නා ලද මූලික පියවර සමඟ නව ලිපිගොනු බොහෝ සංඛ්‍යාවක් විවෘත කිරීමට හැකි විය.

බදු කටයුතු පිළිබඳව උපකාරයක් හෝ තොරතුරු අපේක්ෂා කරන සෑම පුද්ගලයෙකුටම සහාය වීම පිණිස බදු සේවා අංශය අවශ්‍ය නිලධාරී සංඛ්‍යාවෙන් සමන්විතව පවත්වාගෙන යනු ලැබේ. බදු ගෙවන්නන් මෙන්ම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට දැනුම ලබාදීමේ අරමුණ පෙරදැරිව සම්මන්ත්‍රණ සහ දේශන රාශියක් අදාළ කාලපරිච්ඡේදය තුළ දී සංවිධානය කරන ලදි.

සමාලෝචනයට බඳුන් කරන වර්ෂය තුළ දී, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් යුතුව ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මූලික පියවර ගනු ලැබිණි.

## දෙපාර්තමේන්තුවේ දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව පූර්ණ වශයෙන් පරිගණක ගත කරන ලද පද්ධතියකින් සමන්විත වූ බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත් වීම.

## දෙපාර්තමේන්තුවේ මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණපනත්වලට යටත්ව බදු අය කිරීම සහ ,

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

## උපාය මාර්ග හා ඉලක්ක

- ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩ සටහන් ඔස්සේ බදු නීති රීති කෙරෙහි ඔවුන් ස්වේච්ඡාවෙන් එකඟ කරවා ගැනීම, වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හිදී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම.

- වැඩ කිරීමේ කාර්යක්ෂම ක්‍රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

- දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරි කරගෙන වඩාත් ඵලදායී අයුරින් දායක වීමට හැකි වනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම.

## ප්‍රධාන නිලධාරින්

| | |
|---|---|
| **මල්ලිකා සමරසේකර මහත්මිය** | **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්** |
| **එච්.බී.ඒ.සෙනෙවිරත්න මහතා** | **ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>බදු ප්‍රතිපත්ති සම්පාදන හා සංවර්ධන,ව්‍යවස්ථා සම්පාදන, තීරණ හා ජාත්‍යන්තර කටයුතු, ආයෝජන මණ්ඩල ව්‍යවසාය |
| **කේ.ඒ.පී. කලුආරච්චි මහතා** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>සෘජු බදු පරිපාලන |
| **එල්.රාමනායක මහත්මිය** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>විමර්ශන, බදු ආවේක්ෂණ හා අවදානම් කළමනාකරණය |
| **කේ.දහනායක මහත්මිය** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>වක්‍ර බදු පරිපාලන |
| **කේ.ඒ.ජී.අබේරත්න මහතා** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>අය නිශ්කාෂණ සහ පැහැර හරින ලද බදු අය කරගැනීම, නීති, අභියාචනා සහ තොරතුරු |

| | |
|---|---|
| ඩබ්.අනුලාවතී මහත්මිය | **කොමසාරිස්**<br>මානව සම්පත් කළමනාකරණ |
| ආර්.එම්.ආර්.ඩබ්. මංචනායක මහත්මිය | **කොමසාරිස්**<br>සංස්ථාපිත බදු I |
| ඩී.එම්.එල්.අයි.දිසානායක මහතා | **කොමසාරිස්**<br>විශාල බදු ගෙවන්නන්ගේ අංශය |
| ඒ.එන්.ගුරුගේ මහතා | **කොමසාරිස්**<br>සංස්ථාපිත බදු II |
| පී.රෝහිණී මහත්මිය | **කොමසාරිස්**<br>කලාප I |
| ආර්.එම්.පී.එස්.කේ.රාජපක්ෂ මහත්මිය | **කොමසාරිස්**<br>අය නිශ්කාෂණ සහ පැහැර හරින ලද බදු අය කරගැනීම |
| ඒ.ඒ.ඩී.යූ.අබේසිංහ මහතා | **කොමසාරිස්**<br>කලාප II, රඳවාගැනීමේ බදු (පොළී මත), |
| ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙනවිය | **කොමසාරිස්**<br>බදු උපදේශක - මුදල් අමාත්‍යාංශය |
| ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා | **කොමසාරිස්**<br>තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ |
| ඩී.එම්.එස්. දිසානායක මහතා | **කොමසාරිස්**<br>බදු සේවා අංශය, මුද්දර ගාස්තු |
| එම්.ජී. සෝමචන්ද්‍ර මහතා | **කොමසාරිස්**<br>මානව සම්පත් සංවර්ධන |
| සී.එච්. වීරසිංහ මහත්මිය | **කොමසාරිස්**<br>අභ්‍යන්තර විගණන තක්සේරු පාලන |
| එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය | **කොමසාරිස්**<br>විශාල බදු ගෙවන්නන්ගේ අංශය |
| පී.කේ.ජී. සමරතුංග මහතා | **කොමසාරිස්**<br>එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් |
| එස්. කරුණාරත්න මහත්මිය | **කොමසාරිස්**<br>එකතු කළ අගය මත බදු හා එස් වැට් අංශය |
| ඕ.පී.පී.කේ. සිරිසේන මහතා | **කොමසාරිස්**<br>සම්පාදන හා සැපයුම් |
| කේ. ධර්මසේන මහතා | **කොමසාරිස්**<br>විමර්ශන |
| එච්.එම්.ජී. විජේසිංහ මහතා | **කොමසාරිස්**<br>**ජාත්‍යන්තර බදු ප්‍රතිපත්ති** |
| බී.ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය | **කොමසාරිස්**<br>බදු ප්‍රතිපත්ති |
| ඩී.බී. දිසානායක මහතා | **කොමසාරිස්**<br>ජා.ගො.බදු, ආ.සේ.ගාස්තු, ඔට්ටු හා සූදු බදු |
| ඩී.ඩී.එන්.පී. කෝරලේ ආරච්චි මහතා | **කොමසාරිස්**<br>අභියාචනා |
| ටී.එම්. දයානන්ද මහතා | **කොමසාරිස්**<br>තොරතුරු |
| ඩබ්.එස්.කේ. ද කොස්තා මහතා | **කොමසාරිස්**<br>කලාප 3, උපයන විට ගෙවීම්, 1 හා 2 අංශය, 3 අංශය |

# පටුන


2013 වර්ෂය තුළ කාර්ය සාධනයේ සාරාංශය ..... iii

ප්‍රධාන නිලධාරීන් ..... vii

පටුන ..... ix

වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු ..... x

**I කොටස - මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය ..... 1**

**පරිච්ඡේදය 1 - මානව සම්පත් ..... 1**

1.1 අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව ..... 1

1.2 උසස් කිරීම් ..... 2

1.3 විශ්‍රාම ගැනීම් ..... 2

1.4 විනය ක්‍රියා මාර්ග ..... 4

1.5 පුහුණු කිරීම ..... 4

1.5.1 සේවාස්ථ (අභ්‍යන්තර) පුහුණුව ..... 4

1.5.2 විදේශ පුහුණුව ..... 5

**II කොටස - බදු පරිපාලනය ..... 8**

**පරිච්ඡේදය 2 - ආදායම් රැස් කිරීම ..... 8**

2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව ..... 8

2.2 මුළු ආදායම් රැස් කිරීම ..... 9

2.3 මුළු ආදායම – මුදල් ප්‍රවාහය ..... 11

2.4 පෙර වර්ෂය සමඟ ආදායම සැසඳීම ..... 12

2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම ..... 13

2.6 ආදායම් රැස් කිරීම් – ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් ..... 13

2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය ..... 14

2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය ..... 15

2.9 ආදායම් බදු රැස්කිරීම ..... 16

2.9.1 ආදායම් බදු රැස්කිරීම - ආංශීය වශයෙන් පැහැදිලි කිරීම. ..... 16

2.9.2 ආදායම් බදු රැස්කිරීමේ ප්‍රභවමය වශයෙන් විශ්ලේෂණය ..... 17

2.9.3 ආදායම් බද්දට අදාළව වර්ෂය තුළ සිදුකර ඇති ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්: ..... 17

2.10 එකතු කළ අගය මත බදු රැස් කිරීම ..... 22

2.11 ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම. ..... 24

2.11.1 ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළව සිදුකරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්: ..... 25

2.12 ආර්ථික සේවා ගාස්තු රැස් කිරීම ..... 26

2.12.1. ආර්ථික සේවා ගාස්තුවට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් ..... 27

2.13 උපයන විට ගෙවීමේ බදු රැස් කිරීම ..... 27

2.14 රඳවාගැනීමේ බදු (පොළිය සහ නිශ්චිත ගාස්තු මත) ..... 28

2.15 ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම්. ..... 28

2.16 ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම. ..... 29

2.17 මුද්දර බදු රැස්කිරීම ..... 29

2.18 ඉඩම් පැවරීම මත බදු ..... 29

2.19 දේශීය ආදායම් රැස් කිරීම - වසර 2009 සිට 2013 දක්වා ..... 29

**පරිච්ඡේදය 3 - වියදම් සහ ඵලදායිතා අනුපාතය ..... 31**

3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම 2011, 2012 සහ 2013 වර්ෂ සමඟ සැසඳීම ..... 31

3.3 ඵලදායී අනුපාතය ..... 32

3.4 අභ්‍යන්තර විගණන ..... 33

**පරිච්ඡේදය 4 - පැහැර හරින ලද බදු ..... 34**

4.1 පැහැර හරින ලද බදු ..... 34

4.2 හිඟබදු අඩුකිරීම සඳහා සැලසුම. ..... 35

4.3 හිඟබදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම ..... 35

**පරිච්ඡේදය 5 - විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අය කර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා ..... 36**

5.1 විගණන ..... 36

5.2 අභියාචනා ..... 36

5.3 එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණන ..... 37

5.4 අය ක්‍රියාමාර්ග ..... 37

5.5 ආපසු ගෙවීම් ..... 37

**පරිච්ඡේදය 6 - ජාත්‍යන්තර සබඳතා ..... 39**

6.1 ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම් ..... 39

6.1.1 ද්විත්ව බදු ගිවිසුම් සහ බහුපාර්ශ්වීය ගිවිසුම් පිළිබඳ තොරතුරු ..... 39

6.1.2 2013 වර්ෂය තුළ ද්විත්ව බදු ගිවිසුම්වලට අදාළ කටයුතු ..... 40

6.2 විදේශයන්හි පැවති අන්තර් ජාතික බදුකරණ කාර්යයන් සඳහා සහභාගිත්වය: ..... 41

**පරිච්ඡේදය 7 - ව්‍යවස්ථා සම්පාදනය ..... 43**

7.1 වර්ෂය තුළ දී පහත සඳහන් ව්‍යවස්ථාවන් පනවන ලදි. ..... 43

7.2 අනුමත පුණ්‍යායතන ..... 43

7.3 ගැසට් නිවේදන ..... 43

7.4 අර්ථ නිරූපණ කමිටුව ..... 43

**පරිච්ඡේදය 8 - අනෙකුත් කාර්යයන් ..... 45**

8.1 බදු සේවා අංශය ..... 45

8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධානයන් හා නිෂ්කාශන සහතිකපත් පිළිබඳ විස්තර මතු දැක්වේ. ..... 45

8.3 විශ්ලේෂණාත්මක වාර්තා ..... 46

8.4 ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ..... 46

**වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු**

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් අනුව පනවන ලද බදු පහත දැක්වේ:

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බදු | 2007අංක 10, 2008 අංක 9 ,2009 අංක 19 2011 අංක 22, 2012 අංක 8 සහ 2013 අංක 18 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත |
| එකතු කළ අගය මත බදු, (මූල්‍යමය සේවා මත වූ එකතු කළ අගය මත බදු, එකතු කළ අගය මත වූ අත්තිකාරම් බදු විකල්ප එකතු කළ අගය මත බදු ඇතුළත්ව) | 2003අංක 07, 2004 අංක 13, 2005 අංක 06, 2006 අංක 08 සහ 49, 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 09, 2012 අංක 7 සහ 2013 අංක 17 දරන පනත් මගින් සංශෝධිත පරිදි 2002 අංක 14 දරන එකතු අගය මත බදු පනත |
| ආර්ථික සේවා ගාස්තු | 2007අංක 15, 2008 අංක 11 , 2009 අංක 16 , 2011 අංක 11 , 2012අංක 11 සහ 2013 අංක 6 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009අංක 32 ,2011 අංක 10 ,2012 අංක 9 සහ 2013 අංක 11 දරන පනත් මගින් සංශෝධිත 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 1988අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982අංක 43 දරන මුද්දර ගාස්තු පනත, සංශෝධිත පරිදි 2008 අංක 10 සහ 2011 අංක 13 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත |
| කොටස් ගණුදෙනු බද්ද | 2005අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක 13 දරන මුදල් පනත |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005අංක 5 දරන මුදල් පනත, 2006 අංක 11 දරන මුදල් පනත සහ 2008 අංක 08 දරන මුදල් පනත |
| සමාජ වගකීම් බද්ද | |
| පිරිවැටුම් බද්ද ( උතුරු පළාත) | 1981අංක 69 දරන පිරිවැටුම් බද්ද, සංශෝධිත පරිදි |

කලින් පනවනු ලැබ දැනට අවලංගු කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් තක්සේරු සහ අය කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතික ආරක්ෂක බද්ද | 1991අංක 52 දරන ජාතික ආරක්ෂක බද්ද, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1996අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක බද්ද, සංශෝධිත පරිදි |
| ධන බද්ද මත අධිභාරය | 1982අංක 25 දරන ධන බද්ද අධිභාර පනත සහ 1989 අංක 8 දරන පනත |
| ආදායම් බදු මත අධිභාරය | 1982අංක 26 දරන අදායම් බදු මත අධිභාර පනත, 1984 අංක 12 දරන පනත, 1989 අංක 7 දරන පනත ,සංශෝධිත පරිදි |
| හර බද්ද | 2003 අංක 05, 2008 අංක 12, 2009 අංක 17 සහ 2011 අංක 14 යන පනත් මගින් සංශෝධිත 2002 අංක 16 දරන හර බදු පනත |
| බූදල් බද්ද | සංශෝධිත පරිදි 1980 අංක 13 දරන බූදල් බදු පනත |

# I කොටස - මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය

## පරිච්ඡේදය 1 - මානව සම්පත්

### 1.1 අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ නිරත සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ යෙදී සිටි සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වෙන වගුව මගින් පෙන්නුම් කරයි.

**2013.12.31 දිනට කාර්ය මණ්ඩලය**

| තනතුර | අනුමත සංඛ්‍යාව | සේවයේ නිරත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | - |
| අතිරේක කොමසාරිස් ජනරාල් | 1 | - | 1 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් * | | 1 | - |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 9 | 2 | 7 |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 22 | 2 | 20 |
| කොමසාරිස් | 90 | 86 | 4 |
| නියෝජ්‍ය කොමසාරිස් ** | - | 15 | - |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්/නි.කො/සහකාර කොමසාරිස් | 1107 | - | - |
| ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු/ තක්සේරුකරු *** | - | 609 | - |
| ජ්‍යෙෂ්ඨ බදු නිලධාරි/ බදු නිලධාරි *** | | 528 | |
| **ඒකාබද්ධ සේවය** | | | |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | 0 |
| ගණකාධිකාරී | 8 | 5 | 3 |
| අභ්‍යන්තර විගණන | 1 | 1 | - |
| පරිපාලන නිලධාරී (අධිශ්‍රේණිය) | 3 | 3 | 0 |
| භාෂා පරිවර්තක | 9 | 9 | 0 |
| පුස්තකාලයාධිපති | 2 | 1 | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 606 | 500 | 106 |
| අයවැය සහකාර | 2 | 2 | 0 |
| ප්‍රවාහන නිලධාරි | 1 | 0 | 1 |
| රියදුරු | 74 | 72 | 2 |
| කා.සේ.සේ. | 319 | 292 | 27 |
| **අනෙකුත්** | | | |
| ඉංජිනේරු | 1 | 1 | 0 |
| පද්ධති විශ්ලේෂක | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | 0 | 1 |
| නියෝජ්‍ය සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 6 | 4 | 2 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 12 | 11 | 1 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 30 | 26 | 4 |
| පද්ධති පරිපාලන | 3 | 1 | 0 |
| පද්ධති ක්‍රියාකරු | 3 | 2 | 0 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 8 | 7 | 0 |
| පිළිගැනීමේ නිලධාරි | 4 | 3 | 1 |
| සැපයුම් සහකාර | 2 | 0 | 2 |
| තාක්ෂණ නිලධාරී | 2 | 0 | 2 |
| ගොඩනැගිලි අධීක්ෂක | 1 | 0 | 1 |
| ගබඩාකරු | 2 | 0 | 2 |
| වඩු කාර්මික | 1 | 1 | 0 |
| **එකතුව** | **2333** | **2187** | **188** |

* නව සේවා ව්‍යවස්ථාවට අනුව ෂ්ඨවර්තමානයේ දී ජ්‍යෙ ,නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් තනතුර දරන නිලධරයා අතිරේක කොමසාරිස් ජනරාල් ලෙස එම ,තනතුර ඔහුට පමණක් පෞද්ගලික වන සේ පත්කරනු ලැබිය යුතුය.

** නව සේවා ව්‍යවස්ථාවට අනුව, වර්තමානයේ දී නියෝජ්‍ය කොමසාරිස් තනතුරු දරන නිලධරයන් කොමසාරිස්වරුන් ලෙස පත්කරනු ලැබිය යුතුය.

*** නව සේවා ව්‍යවස්ථාවට අනුව, ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු/ තක්සේරුකරු/ ජ්‍යෙෂ්ඨ බදු නිලධාරී/ බදු නිලධාරී යන තනතුරු අවලංගු කරනු ලබන අතර, ඒ වෙනුවට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්/ නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් තනතුරු සංඛ්‍යාව 1107 ක් පත්කරනු ලැබේ. ඔවුන් මෙතෙක් පත්කරනු ලැබ නොමැත.

## 1.2 උසස් කිරීම්

පහත සඳහන් ජ්‍යෙෂ්ඨ කොමසාරිස් සහ කොමසාරිස්වරුන් වෙත නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන් ලෙස උසස් වීම් ලබන ලදි.

| නම | ක්‍රියාත්මක දිනය |
|---|---|
| කේ. දහනායක මහත්මිය | 2013.04.02 |
| කේ.ඒ.ජී. අභයරත්න මහතා | 2013.08.13 |
| ඩී.බී. ජයසේකර මහතා | 2013.08.13 |
| ඩබ්ලිව්. අනුලාවතී මහත්මිය | 2013.12.19 |
| ආර්.එම්.ආර්.ඩබ්ලිව්. මංචනායක මහත්මිය | 2013.12.19 |

- ❖ නියෝජ්‍ය කොමසාරිස්වරුන් 68 ක් කොමසාරිස් ධූරයට උසස් කරන ලදී.
- ❖ නියෝජ්‍ය කොමසාරිස්වරුන් තිදෙනෙකු (03) වෙත කොමසාරිස්වරුන්ගේ රාජකාරී පවරන ලදී.
- ❖ ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් හය දෙනෙකු (06) වෙත නියෝජ්‍ය කොමසාරිස්වරුන්ගේ රාජකාරීන් පවරන ලදි.

## 1.3 විශ්‍රාම ගැනීම්

පහත නම් සඳහන් නිලධාරින් වසර තුළ දී විශ්‍රාම ගැනීමට යෙදුනි.

| | |
|---|---|
| • ඩී.එම්. නන්දාවතී මහත්මිය | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| • ඩබ්.එම්. මෙන්ඩිස් මහතා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| • ඒ.එල්.ඒ. සිරිසේන මහතා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| • එච්.එම්.සී.අයි. ගුණසේකර මහත්මිය | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| • ඩී.බී. ජයසේකර මහතා | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| • ඩබ්.වී.පී. කරුණාරත්න මහතා | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් |
| • පී.ඒ.වී. ප්‍රේමරත්න මහතා | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් |
| • අයි.එම්.බී. සෙනෙවිරත්න බණ්ඩා මහතා | කොමසාරිස් |

**අනෙකුත් විශ්‍රාම ගැනීම්**

| | |
|---|---|
| • නියෝජ්‍ය කොමසාරිස් | 03 |
| • ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | 02 |
| • තක්සේරුකරු | 11 |
| • රාජ්‍ය කළමනාකරණ සහකාර | 16 |
| • පද්ධති ක්‍රියාකරු | 01 |
| • පද්ධති පාලක | 02 |
| • රියදුරු | 03 |

**ඩී.එම්. නන්දාවතී මහත්මිය**

ඩී.එම්. නන්දාවතී මහත්මිය 1978 දෙසැම්බර් මස 01 වන දින තක්සේරුකරුවෙකු වශයෙන් දෙපාර්තමේන්තුවට සම්බන්ධ විය. විවිධ තනතුරුවල දැඩි කැපවීමකින් සේවය කළ ඇය 2009 වසරේ දී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධූරයට පත් විය. දේශීය ආදායම් සේවයේ වසර 34 ක දීර්ඝ සේවා කාලපරිච්ඡේදයක් නිමා කළ ඇය 2013 අප්‍රේල් 02 වැනි දින සේවයෙන් විශ්‍රාම ගත්තා ය. නන්දාවතී මහත්මිය තම ධූර කාලය තුළ පුහුණු වැඩ සටහන්වලට මෙන්ම 2006 වසරේ ඉන්දියාවේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වන බදු ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රායෝගික ගැටළු සහ බදු පරිපාලනය පිළිබඳ පුහුණු වැඩ සටහන් මෙන්ම, 2007 වසරේ ඉන්දියාවේ NADT හි පැවති විමර්ශන සහ කළමනාකරණය සම්බන්ධ විශේෂ පුහුණු වැඩසටහන් ඇතුළුව බදුකරණය හා සම්බන්ධ විදේශ වැඩසටහන් කිහිපයකට දෙපාර්තමේන්තුව වෙනුවෙන් සහභාගි වූවාය.

**ඩබ් .එම් .මෙන්ඩිස් මහතා**

1980 වසරේ දෙපාර්තමේන්තුවට බැඳුනු ඩබ්.එම්. මෙන්ඩිස් මහතා 2011 දෙසැම්බර් 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධූරයට උසස් කරන ලදි. ඩබ්.එම්. මෙන්ඩිස් මහතා 2013 අගොස්තු 10 වන දින විශ්‍රාම ගන්නා විට දෙපාර්තමේන්තුවේ වසර 33 ක සේවා කාලපරිච්ඡේදයක් කැපවීමෙන් යුතුව නිම කොට තිබුණි.

**ඒ.එල්.ඒ. සිරිසේන මහතා**

1981 වසරේ දෙපාර්තමේන්තුවට බැඳුණු ඒ.එල්.ඒ. සිරිසේන මහතා 2012 මැයි 21 වන දින නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධූරයට පත් විය. ඔහු 2013 ජූලි 25 වන දින සේවයෙන් විශ්‍රාම ගන්නා ලදි. ඒ.එල්.ඒ. සිරිසේන මහතා තම ධූර කාලය තුළ පුහුණු වැඩ සටහන්වලට මෙන්ම, එක්සත් රාජධානියේ පැවති බදු විශ්ලේෂණ සහ ආදායම් පුරෝකථනය හා සම්බන්ධ වැඩ සටහන්, 2007 වසරේ ප්‍රංශයේ පැවති බදු ගිවිසුම් හා සම්බන්ධ බදුකරණය පිළිබඳ 12 වන වාර්ෂික අන්තර්ජාතික රැස්වීම, 2007 වසරේ ඉන්දියාවේ NADT හි පැවති විමර්ශනය සහ කළමනාකරණය පිළිබඳ විශේෂ පුහුණු වැඩ සටහනට සහ 2013 සිංගප්පූරුවේ පැවති E – governance සහ පරිවර්තන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන ඇතුළුව, බදුකරණය හා සම්බන්ධ විදේශ වැඩසටහන් කිහිපයක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව නියෝජනය කළේය.

**එච්.එම්.සී.අයි. ගුණසේකර මහත්මිය**

එච්.එම්.සී.අයි. ගුණසේකර මහත්මිය 1981 වසරේ දී තක්සේරුකරුවෙකු ලෙස දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූවා ය. 2013 දෙසැම්බර් 12 වන දින ඇය විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඇය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරියක ලෙස කටයුතු කරමින් සිටියා ය. ගුණසේකර මහත්මිය, දේශීය ආදායම් සේවයේ විවිධ තනතුරු හොබවමින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් වසර 32 ක කැපවුණු සේවා කාලපරිච්ඡේදයක් නිම කර තිබිණි. ඇයගේ ධූර කාලය තුළ පුහුණු වැඩ සටහන්වලට මෙන්ම, 1993/1994 වසරවල ජපානයේ පැවති (JICA) බදුකරණය හා සම්බන්ධ සම්මන්ත්‍රණය, 2012 වසරේ නේපාලයේ පැවති බදු ගෙවන්නන්ගේ සේවාවන් සම්බන්ධ SAARC සමුළුව, 2006 වසරේ ඉන්දියාවේ පැවති සංවර්ධනය වන රටවල බදු ප්‍රතිපත්ති සහ පරිපාලනයේ ප්‍රායෝගික ගැටළු හා සම්බන්ධ පුහුණු වැඩසටහන, 2007 වසරේ ඉන්දියාවේ පැවති විමර්ශනය සහ කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩ සටහන සහ 2013 වසරේ සිංගප්පූරුවේ පැවති E – governance සහ පරිවර්තන කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩ සටහන් කිහිපයක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව නියෝජනය කළාය.

**ඩී.බී. ජයසේකර මහතා**

ඩී.බී. ජයසේකර මහතා 1981 වසරේ දී තක්සේරුකරුවෙකු ලෙස දෙපාර්තමේන්තුවට බැඳුණි. ඔහු විවිධ තනතුරු දරමින් දෙපාර්තමේන්තුවේ වසර 32 ක කාලයක් සේවය කළේය. ඔහු 2013 දෙසැම්බර් 04 වන දින විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකු (රාජකාරී ආවරණ) ලෙස කටයුතු කරමින් සිටියේ ය. ඔහුගේ ධූර කාලය තුළ විවිධ පුහුණු වැඩසටහන් මෙන්ම 2006 වසරේ ඉන්දියාවේ පැවති සංවර්ධනය වෙමින් පවත්නා රටවල බදු ප්‍රතිපත්ති, ගැටළු සහ බදු පරිපාලනය පිළිබඳ ප්‍රායෝගික වැඩ සටහන, 2007 වසරේ ඉන්දියාවේ NADT හි පැවති විමර්ශන සහ කළමනාකරණය හා සම්බන්ධ විශේෂ පුහුණු වැඩ සටහන, 2011 වසරේ ප්‍රංශයේ පැවති බදු පරිපාලනය පිළිබඳ පාඨමාලාව සහ E – governance සහ පරිවර්තන කළමනාකරණය පිළිබඳ සිංගප්පූරුවේ පැවති පුහුණු වැඩසටහන ඇතුළුව බදුකරණය පිළිබඳ විදේශ පුහුණු වැඩසටහන් කිහිපයක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව නියෝජනය කළේය.

## 1.4 විනය ක්‍රියා මාර්ග

| සේවා ගණය | 2013.01.01 දිනට ඉතිරිව තිබූ සිද්ධීන් ගණන | වර්ෂය තුළ ආරම්භ කරන ලද සිද්ධීන් ගණන | වර්ෂය තුළ අවසන් කළ සිද්ධීන් ගණන | 2013.12.31 දිනට නිම කිරීමට ඉතිරිව තිබූ සිද්ධීන් ගණන |
|---|---|---|---|---|
| තක්සේරුකරු | 9 | 1 | 1 | 9 |
| බදු නිලධාරි | - | - | - | - |

## 1.5 පුහුණු කිරීම

### 1.5.1 සේවාස්ථ (අභ්‍යන්තර) පුහුණුව

දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය තක්සේරුකරුවන් සහ බදු නිලධාරින් සඳහා නිරන්තරයෙන් පුහුණු පාඨමාලා සහ විභාග පවත්වනු ලැබේ. විශේෂයෙන්ම බදුකරණය සහ ගිණුම්කරණය පිළිබඳව ඔවුන්ගේ දැනුම දියුණු කිරීමත්, විශ්ලේෂණාත්මක හැකියාවන් නංවාලීමත් මෙමගින් අපේක්ෂා කෙරේ. නිලධාරීන්ගේ අදාළ ශ්‍රේණිවල ස්ථිර කිරීමට අවශ්‍ය විවිධ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා සහ රාජකාරී ඉටු කිරීම සඳහා දැනුම ලබාගැනීම පිණිස අවශ්‍ය කෙරෙන විෂයයන් අරමුණු කොට ගෙන මෙම පුහුණු පාඨමාලා සකසා ඇත. වසර තුළ දී පුහුණු කරන ලද සහ කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පරීක්ෂණවල විස්තර පහත සඳහන් පරිදි දැක්වේ.

- **තක්සේරුකරුවන් සඳහා**

| පාඨමාලාව/පරීක්ෂණය | පුහුණුකරුවන් සංඛ්‍යාව | |
|---|---|---|
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පවත්වන ලද පුහුණු පංති | 60 | |
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පවත්වන ලද පුහුණු පංති | 60 | |
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පවත්වන ලද පුහුණු පංති. | 3 | |
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය | 4 වන ප්‍රයත්නය | 11 |
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය | 1 වන ප්‍රයත්නය | 54 |
| | 2 වන ප්‍රයත්නය | 12 |

- බදු නිලධාරින් සඳහා

| පාඨමාලාව/පරීක්ෂණය | පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|
| II ශ්‍රේණියේ II පංතියේ බදු නිලධාරින් සඳහා වූ II ශ්‍රේණියේ II පංතියේ ස්ථිර කිරීම සඳහා පවත්වන ලද පුහුණු පංති | 3 |
| II ශ්‍රේණියේ III පංතියේ බදු නිලධාරින් සඳහා වූ II ශ්‍රේණියේ II පංතියේ ස්ථිර කිරීම සඳහා අවසන් දෙපාර්තමේන්තු පරීක්ෂණය | 3 |

- **සම්මන්ත්‍රණ/වැඩමුළු යනාදිය**

| විෂය | වසර තුළ දී පවත්වන ලද සම්මන්ත්‍රණ සහ වැඩ මුළු සංඛ්‍යාව | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| එ.අ.බදු විගණනය | 01 | 60 |
| වෙළෙඳපොළ චර්යාව සහ රජයේ මැදිහත්වීම | 01 | 48 |
| ජාතික ආදායම සහ බදුකරණය | 01 | 50 |
| පැවරුම් මිල ක්‍රමය සඳහා ආදායම් බදු විගණනය සහ මූලික ව්‍යුහය | 01 | 57 |
| (SMES) පිළිබඳ බදුකරණය | 01 | 85 |
| වත්කම් ප්‍රකාශනය විගණනය | 01 | 60 |

### 1.5.2 විදේශ පුහුණුව

බදු පරිපාලකයින් වශයෙන් නිලධාරින්ගේ වෘත්තීයමය මට්ටම් පවත්වාගෙන යාම පිණිස වෙනත් රටවල බදු නීති පරිපාලනය සහ මනා පරිචයන්හි කරන ලද ප්‍රගමනයන්ට ඔවුන් නැඹුරු කිරීමේ අරමුණ ඇතිව විදේශයන්හි පැවති පුහුණු වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගිවීමට දෙපාර්තමේන්තුවේ නිලධාරින් කිහිප දෙනෙකුට අවශ්‍ය කටයුතු සලසා දෙන ලදි. එසේ විදේශයන් සඳහා යවනු ලැබූ නිලධාරින් සහ ඔවුන් සහභාගි වූ සම්මන්ත්‍රණ වැඩමුළු සහ වැඩ සටහන් පිළිබඳව විස්තර පහත දැක්වේ.

| | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩ සටහනේ/ සම්මන්ත්‍රණයේ වැඩමුළුවේ නම | පුහුණුව ලැබූ රට | කාල සීමාව |
|---|---|---|---|---|
| 1 | කේ.ඒ.පී. කලුආරච්චි මයා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | බදු පරිපාලකයින්ගේ පොදු රාජ්‍ය මණ්ඩලය 34 වන තාක්ෂණික සමුළුව | රුවන්ඩා | 20131.02.1 2013.10.25 |
| 2 | කේ .ඒ.ජී. අබේරත්න මයා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (රාජකාරී ආවරණ) | බදු පරිපාලකයින්ගේ පොදු රාජ්‍ය මණ්ඩලය 34 වන තාක්ෂණික සමුළුව | රුවන්ඩා | 20131.02.1 2013.10.25 |
| 3 | ආර්.එම්.ආර්.ඩබ්ලිව් .මංචනායක මිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (රාජකාරී ආවරණ) | දේශීය ආදායම් බලධාරීන් සඳහා සිංගප්පූරුවේ සංචාරය | සිංගප්පූරුව | 201311..09 2013.11.12 |
| 4 | ඩී.එම්.එල්.අයි. දිසානායක මයා කොමසාරිස් | බදු පරිපාලකයින්ගේ පොදු රාජ්‍ය මණ්ඩලය 34 වන තාක්ෂණික සමුළුව | රුවන්ඩා | 20131.02.1 2013.10.25 |
| 5 | ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා කොමසාරිස් | 3 වන අන්තර්ජාතික බදු සමුළුවේ ඒකාබද්ධ බදු මණ්ඩලය | නයිජීරියාව | 20131.02.1 2013.10.25 |
| 6 | ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙනවිය කොමසාරිස් | 5 වන අන්තර්ජාතික බදු සංවාද සමුළුව | මොරොක්කෝව | 20131.2.03 2013.12.07 |

| | | | | |
|---|---|---|---|---|
| 7 | ජේ.පී.ඩී.ආර්. ජයසේකර මයා<br>කොමසාරිස් | දේශීය ආදායම් බලධාරීන් සඳහා සිංගප්පූරුවේ සංචාරය | සිංගප්පූරුව | 201311..09<br>2013.11.12 |
| 8 | ඩී.එම්.එස්. දිසානායක මයා<br>කොමසාරිස් | EOI පිළිබඳ විශ්ව සංසද පුහුණුව සවියුරු සමාලෝචනය පිළිබඳ ඵලදායි වැඩපිළිවෙල. | පිලිපීනය | 20130.9.10<br>2013.09.14 |
| 9 | එම්.ජී. සෝමචන්ද්‍ර මයා<br>කොමසාරිස් | ඒකාබද්ධ බදු මණ්ඩලය 3 වන අන්තර්ජාතික බදු සමුළුව. | නයිජීරියාව | 20131.02.1<br>2013.10.25 |
| 10 | පී.ජී.කේ. සමරතුංග මයා<br>කොමසාරිස් | අන්තර්ජාතික ධාරිතා ගොඩනැගීම පිළිබඳ වැඩමුළුව. | තායිලන්තය හා නවසීලන්තය | 2013.121.2<br>2013.12.21 |
| 11 | කේ. ධර්මසේන මයා<br>කොමසාරිස් | EOI පිළිබඳ විශ්ව සංසද පුහුණුව සවියුරු සමාලෝචනය පිළිබඳ ඵලදායි වැඩපිළිවෙල. | පිලිපීනය | 20130.9.10<br>2013.09.14 |
| 12 | එච්.එම්.ජී. විජේසිංහ මයා<br>කොමසාරිස් | IRBM - නිස්සාරණ කර්මාන්ත සඳහා මිල පැවරුම් අභිලාෂයන් | මලයාසියාව | 20130.4.22<br>2013.04.26 |
| 13 | කේ.ඒ.ඩී.පී. කෝරලේආරච්චි මයා<br>කොමසාරිස් | බදු පරිපාලකයින්ගේ පොදු රාජ්‍ය මණ්ඩලය<br>34 වන තාක්ෂණික සමුළුව | රුවන්ඩා | 20131.02.1<br>2013.10.25 |
| 14 | ඒ.ඒ. දයාරත්න මයා<br>කොමසාරිස් | රාජ්‍ය මූල්‍යයෙහි ලා මුදල් හා ක්‍රමසම්පාදන කාර්ය මණ්ඩලය සඳහා විධායක පුහුණු වැඩසටහන | සිංගප්පූරුව | 20130.72.9<br>2013.08.02 |
| 15 | එම්.ජී. ගුණසිරි මයා<br>කොමසාරිස් | රාජ්‍ය මූල්‍යයෙහි ලා මුදල් හා ක්‍රමසම්පාදන කාර්ය මණ්ඩලය සඳහා විධායක පුහුණු වැඩසටහන | සිංගප්පූරුව | 20130.72.9<br>2013.08.02 |
| | | දේශීය ආදායම් බලධාරීන් සඳහා සිංගප්පූරුවේ සංචාරය | සිංගප්පූරුව | 201311..09<br>2013.11.12 |
| 16 | ඩී. රංගල්ල මයා<br>කොමසාරිස් | IRBM : IBFD මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ බදු මගහැරීම | මලයාසියාව | 201305..06<br>2013.05.10 |
| | | දේශීය ආදායම් බලධාරීන් සඳහා සිංගප්පූරුවේ සංචාරය | සිංගප්පූරුව | 201311..09<br>2013.11.12 |
| 17 | ආර්.එස්. සමරනායක මහතා<br>කොමසාරිස් | IRBM – OECD මිල පැවරුම් සිද්ධි අධ්‍යයනය | සිංගප්පූරුව | 2013.10.02<br>2013.10.06 |
| 18 | එම්.එස්.එම්. සියාන් මයා<br>කොමසාරිස් | අන්තර්ජාතික සංචාරය - නායකත්ව වැඩ සටහන | අමෙරිකා එක්සත් ජනපදය | 201309..09<br>2013.09.28 |
| | | දේශීය ආදායම් බලධාරීන් සඳහා සිංගප්පූරුවේ සංචාරය | සිංගප්පූරුව | 201311..09<br>2013.11.12 |
| 19 | යූ.පී.එස්.ඒ. ජයලත් මයා<br>කොමසාරිස් | දේශීය ආදායම් බලධාරීන් සඳහා සිංගප්පූරුවේ සංචාරය | සිංගප්පූරුව | 201311..09<br>2013.11.12 |
| 20 | ඩී.යූ.ඒ. ජයවර්ධන මයා<br>කොමසාරිස් | රාජ්‍ය මූල්‍යයෙහි ලා මුදල් හා ක්‍රමසම්පාදන කාර්ය මණ්ඩලය සඳහා විධායක පුහුණු වැඩසටහන | සිංගප්පූරුව | 20130.72.9<br>2013.08.02 |
| | | දේශීය ආදායම් බලධාරීන් සඳහා සිංගපූප්රුවේ සංචාරය | සිංගප්පූරුව | 201311..09<br>2013.11.12 |
| 21 | ජී.ඒ.ජේ. ගජධීර මයා<br>කොමසාරිස් | IRBM : OECD; බදු හා අපරාධ | මලයාසියාව | 20130.52.7<br>2013.05.31 |
| 22 | ජී.පී. මහින්ද කුමාර මයා<br>නියෝජ්‍ය කොමසාරිස් | බදුකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2013.10.18<br>2013.11.13 |

| | | | | |
|---|---|---|---|---|
| 23 | ජී.එල්.ජී. විමලරත්න මයා<br>නියෝජ්‍ය කොමසාරිස් | ඒකාබද්ධ බදු මණ්ඩලය 3 වන අන්තර්ජාතික බදු සමුළුව. | නයිජීරියාව | 20131.02.1<br>2013.10.25 |
| 24 | එල්.ආර්. පෙරේරා මහතා<br>නියෝජ්‍ය කොමසාරිස්<br>(රාජකාරී ආවරණ) | ඒකාබද්ධ බදු මණ්ඩලය 3 වන අන්තර්ජාතික බදු සමුළුව. | නයිජීරියාව | 20131.02.1<br>2013.10.25 |
| 25 | ආර්.පී.එච්. ප්‍රනාන්දු මයා<br>නියෝජ්‍ය කොමසාරිස්<br>(රාජකාරී ආවරණ) | අන්තර්ජාතික සංචාරය - නායකත්ව වැඩ සටහන | අමෙරිකා එක්සත් ජනපදය | 201309..09<br>2013.09.28 |
| 26 | බී.කේ.එස්. ශාන්ත මයා<br>නියෝජ්‍ය කොමසාරිස්<br>(රාජකාරී ආවරණ) | අන්තර්ජාතික සංචාරය - නායකත්ව වැඩ සටහන | අමෙරිකා එක්සත් ජනපදය | 201309..09<br>2013.09.28 |
| 27 | කේ.ජී.පී.කේ. ධර්මවර්ධන මයා<br>ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | CATA - කළමනාකරණ ශක්‍යතා අත්පත් කරගැනීම | එක්සත් රාජධානිය | 2013.07.29<br>2013.09.06 |
| 28 | ඒ.එම්. නෆීල් මයා<br>ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | බදු විශ්ලේෂණ සහ ආදායම් පුරෝකථන වැඩ සටහන | අමෙරිකා එක්සත් ජනපදය | 2013.06.23<br>2013.07.19 |
| 29 | එම්.එල්.ජේ.ජී. චන්ද්‍රසිරි මයා<br>ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | බදු විශ්ලේෂණ සහ ආදායම් පුරෝකථන වැඩ සටහන | අමෙරිකා එක්සත් ජනපදය | 2013.06.23<br>2013.07.19 |
| 30 | ඒ.ඒ.ඩී. හේමලතා මෙනවිය<br>තක්සේරුකරු | CATA - පොදු රාජ්‍ය මණ්ඩලීය බදු පරීක්ෂකයන්ගේ පාඨමාලාව | එක්සත් රාජධානිය | 2013.07.29<br>2013.09.06 |
| 31 | ආර්.එම්.එස්.පී.කේ. රත්නායක මයා<br>ජ්‍යෙෂ්ඨ බදු නිලධාරී | ප්‍රජා පාදක සංවර්ධන වැඩසටහන | ඉන්දියාව | 2013.09.02<br>2013.09.27 |

### 1.5.3 FMRP මගින් ලබාදෙන ලද විදේශ පුහුණු

FMRP හි අනුග්‍රහය යටතේ සිංගප්පූරුවෙහි පවත්වන ලද "E-governance & Change Management" සම්බන්ධ පුහුණු වැඩසටහන මෙම වසර තුළ දී පවත්වන ලදි. ඒ අනුව, ආදායම් පරිපාලනය කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සම්බන්ධ විශේෂ පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් 117 දෙනෙකු සහභාගී වන ලදි.

# II කොටස - බදු පරිපාලනය

## පරිච්ඡේදය 2 - ආදායම් රැස් කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය තුළ දී රු. **492,539,431,267/-** ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. (ඊට මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යටතේ ගිණුම්ගත වන සමාජ වගකීම් බද්ද, පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලැබූ ජාතිය ගොඩනැගීමේ බද්ද යන රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ.). විවිධ බදු රැස්කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු සංඛ්‍යාවේ එකතුව 2013 දෙසැම්බර් 31 දින වනවිට 577,417 ක්ව පැවතිණි.

### 2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව

වසර අවසාන වන විට බදු ගෙවීම සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව පහත අංක 01 වගුවෙහි දක්වා ඇත.

| වගුව 01 - 2013.12.31 දිනට බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව | | |
|---|---|---|
| **ආදායම් බද්ද** | | |
| *සංස්ථාපිත* | | |
| වාසික සමාගම් | 36,061 | |
| නිර්වාසික සමාගම් | 583 | |
| රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු ආයතන | 46 | **36,690** |
| *සංස්ථාපිත නොවන* | | |
| පුද්ගලයින් | 161,482 | |
| හවුල් ව්‍යාපාර | 17,180 | |
| පුද්ගල මණ්ඩල ආදිය | 914 | |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තියන් (2013.03.31 දිනට) * | 297,240 | **476,816** |
| **ආදායම් බදු ගෙවන මුළු සංඛ්‍යාව** | | **513,506** |
| අනෙකුත් බදු ගෙවන්නන් | | |
| **ආර්ථික සේවා ගාස්තු (ESC)** සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර | 4,561 | |
| **එකතු කළ අගය මත බදු** (VAT) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 14,851 | |
| **මුල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු** (VAT) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 170 | |
| **වෛකල්පිත එකතු කළ අගය මත බදු** සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 499 | |
| **ජාතිය ගොඩ නැගීමේ බද්ද (NBT)** සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 20,480 | |
| **ඔට්ටු බදු** ලිපිගොනු සංඛ්‍යාව | 1,067 | |
| **සූදු බදු** ලිපිගොනු සංඛ්‍යාව | 5 | |
| **මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **41,628** |
| අනෙකුත් බදු ගෙවන්නන් මුළු සංඛ්‍යාව | | |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ලියාපදිංචි වූ **සේවා යෝජකයන්** | 11,778 | |
| **පොළිය මත රඳවා ගත් බදු** (රඳවා ගැනීමේ බදු නියෝජිතයන්) | 2,517 | |
| **නිශ්චිත ගාස්තු යටතේ රඳවා ගත් බදු** (විධිමත් මාසික උපලේඛන සැපයුම්කරුවන්) | 84 | |
| **ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද** | 253 | |
| මුද්දර බදු ( විධිමත් මාසික උපලේඛනගත සැපයුම්කරුවන්) | 7,648 | **22,280** |
| **2013.12.31 දිනට මුළු ලිපිගොනු / බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව** | | **577,414** |

** රජයේ සේවකයන් 28,589 ක සංඛ්‍යාවක් ඇතුළත් වන අතර, සේවා යෝජකයින් විසින් සපයන ලද අසම්පූර්ණ ප්‍රකාශනවල සේවා නියුක්තිකයින් ගණන ඇතුළත් නොවේ.*

**සටහන්:**

(i) වෙනත් ආදායමක් නොමැති නම් උ.වි.ගෙ. ක්‍රමය යටතේ පාරිශ්‍රමිකයෙන් බදු අඩු කරගත් යම් සේවා නියුක්තිකයෙකු සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුවෙහි වෙනම ලිපිගොනුවක් පවත්වාගෙන යනු නොලැබේ.

(ii) අවසාන බද්දක් ලෙස ප්‍රභවය මත ආදායම් බදු අය කරනු ලබන පුද්ගලයින් (තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළිය, ලාභාංශ ආදිය) සංස්ථාපිත නොවන ලිපිගොනු යටතේ ඇතුළත් කොට නොමැත.

(iii) ඉහත ආදායම් බදු ලිපිගොනු අතර රාජ්‍ය නොවන සංවිධාන සඳහා ලිපිගොනු 218 ක් ද ඇතුළත් වේ.

## 2.2 මුළු ආදායම් රැස් කිරීම

වර්ෂය සඳහා මුළු ආදායම් රැස් කිරීම රුපියල් මිලියන 492,539 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 49,084 ක හෙවත් සියයට 11.07 ක ඉහළයාමක් පෙන්නුම් කරයි. අනුකූලතාව වර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ බලාත්මක කිරීමට බදු පරිපාලනය විසින් ගන්නා ලද පුළුල් ක්‍රියා මාර්ග හේතු කොට ගෙන ප්‍රධාන වශයෙන්ම මෙම ජයග්‍රහණයන් අත්පත් කර ගැනීමට හැකි විය. බදු ගෙවන්නන් හඳුනා ගැනීම, බදු බැඳියාවන් තක්සේරු කිරීම සහ බදු රැස් කිරීම කඩිනම් කිරීම තුළින් ඉහත සඳහන් කරන ලද වැඩි වීම සිදු විය.

රජයේ ආදායමට වර්ෂය තුළ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ දායකත්වයෙහි ප්‍රතිශතය සියයට 43.30 කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස්කිරීම, සියයට 89.90 ක සාධනීය තත්ත්වයක් පෙන්වයි.

2013 වසර සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා මගින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුව, බදු ගෙවිය හැකි සැපයුම කාර්තුවකට රුපියල් මිලියන 3 හෝ වාර්ෂිකව රුපියල් මිලියන 12 නොඉක්මවන තැනැත්තන්ගේ එකතු කළ අගය මත බදු ලියාපදිංචිය අක්‍රිය කිරීමට පියවර ගන්නා ලදි. කෙසේ වුවද, එ.අ.බ. රැස්කිරීම පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 13,031 කින් වැඩි විය. එසේ වැඩිවීම සඳහා හේතුව බදු අය කළ හැකි කටයුතු ලෙස තොග සහ සිල්ලර වෙළෙඳ අංශයන් ඇතුළත් කිරීම මගින් එකතු කළ අගය මත බද්දේ විෂය පථය පුළුල් කිරීම විය හැකි ය.

ආදායම් බදු රැස්කිරීම් පෙර වර්ෂයට වඩා සියයට 26.21 කින් ඉහළ ගොස් ඇත. සංස්ථාපිත ආදායම් බද්දෙන් ලැබූ ආදායම සහ පොළිය මත රඳවාගැනීමේ බදු රැස් කිරීම පෙර වර්ෂයට සාපේක්ෂව වර්ෂය තුළ දී ඉහළ ගොස් ඇත.


අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ග රැස් කිරීම් හි අගයන් 02 වන වගුවෙහි දක්වා ඇති අතර, එය 01 වන සටහනෙන් නිරූපණය කෙරේ. වර්ෂය තුළ මූල්‍ය ප්‍රවාහය 03 වන වගුවෙහි දක්වා ඇති අතර, එය 02 වන සටහනෙන් නිරූපණය කෙරේ.

| වගුව 02 - මුළු ආදායම් රැස්කිරීම - 2013 | | | | |
|---|---|---|---|---|
| **බදු වර්ගය** | **ආදායම් ඇස්තමේන්තුව රු. (සංශෝධිත )** | **ආදායම් රැස් කිරීම් රු.** | **රැස් කිරීම් ඇස්තමේන්තුවේ % ක් ලෙස** | **රැස් කිරීම් මුළු ආදායමේ % ක් ලෙස** |
| ආදායම් බද්ද | 226,775,000,000 | 199,070,030,704 | 87.79% | 40.42% |
| ආර්ථික සේවා ගාස්තුව | 12,763,000,000 | 6,595,600,863 | 51.68% | 1.34% |
| හර බද්ද | - | (83,401) | | 0.00% |
| ඔට්ටු හා සූදු බද්ද | 850,000,000 | 591,870,451 | 69.63% | 0.12% |
| කොටස් ගණුදෙනු බද්ද | 2,000,000,000 | 1,197,409,071 | 59.87% | 0.24% |
| එකතු කළ අගය මත බද්ද | 255,353,000,000 | 217,686,923,042 | 85.25% | 44.20% |
| භාණ්ඩ හා සේවා බද්ද | 15,200,000 | 15,976,746 | 105.11% | 0.00% |
| පිරිවැටුම් බද්ද | 11,776,000 | 218,080,060 | 1851.90% | 0.04% |
| ජාතික ආරක්ෂක බද්ද | 2,435,000 | 2,149,612 | 88.28% | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 1,250,000,000 | 750,907,497 | 60. 07% | 0.15% |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද * | 48,782,000,000 | 59,397,332,038 | 121.76% | 12.06% |
| මුද්දර බද්ද ** | - | 6,884,387,291 | | 1.40% |
| ඉඩම් බද්ද | 82,000,000 | 96,741,230 | 117.98% | 0.02% |
| සමාජ වගකීම් බද්ද *** | 14,000,000 | 32,106,064 | 229.33% | 0.01% |
| **මුළු ආදායම් රැස්කිරීම** | **547,878,411,000** | **492,539,431,267** | **89.90%** | **100.00%** |

* පළාත් සභාවලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම් - රු.18,460,661,347.00


** පළාත් සභාවලට මාරු කරන ලද මුද්දර බදු රැස්කිරීම් - රු.6,884,387,291.00

*** මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත මාරු කරන ලද සමාජ ආරක්ෂණ බදු රැස්කිරීම් රු.32,106,064.00




## 2.3 මූළ ආදායම – මුදල් ප්‍රවාහය

| වගුව 03 - මූළ මුදල් ප්‍රවාහය - 2013 | | |
|---|---|---|
| මාසය | ආදායම් රැස් කිරීම් (ස.ආ.බ. ඇතුළුව) රු. | සමුච්චිත ආදායම් රැස් කිරීම් රු. |
| ජනවාරි | 41,485,980,187.68 | 41,485,980,187.68 |
| පෙබරවාරි | 44,795,059,800.28 | 86,281,039,987.96 |
| මාර්තු | 28,496,653,516.91 | 114,777,693,504.87 |
| අප්‍රේල් | 42,509,977,707.84 | 157,287, 671,212.71 |
| මැයි | 43,511,825,075.19 | 200,799,496,287.90 |
| ජූනි | 31,815,053,590.19 | 232,614,549,878.09 |
| ජූලි | 38,080,548,642.05 | 270,695,098,520.14 |
| අගෝස්තු | 45,960,792,774.97 | 316,655,891,295.11 |
| සැප්තැම්බර් | 48,461,067,046.53 | 365,116,958,341.64 |
| ඔක්තෝබර් | 37,342,569,392.60 | 402,459,527,734.24 |
| නොවැම්බර් | 50,451,232,385.65 | 452,910,760,119.89 |
| දෙසැම්බර් | 39,628,671,147.42 | 492,539,431,267.31 |



## 2.4 පෙර වර්ෂය සමඟ ආදායම සැසඳීම

| බදු වර්ගය | 2013 ආදායම් රැස් කිරීම් රු. | 2012 ආදායම් රැස් කිරීම් රු. | රැස්කිරීමේ අඩුවීම හෝ වැඩිවීම (%) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බදු | 199,070,030,704 | 157,728,902,903 | 26.21 |
| ආර්ථික සේවා ගාස්තු | 6,595,600,863 | 14,864,241,267 | -55.63 |
| හර බද්ද | (83,401) | (481,999) | -82.70 |
| ඔට්ටු හා සූදු බද්ද | 591,870,451 | 289,175,098 | 104.68 |
| කොටස් ගණුදෙනු බද්ද | 1,197,409,071 | 1,285,744,429 | -6.87 |
| එකතු කළ අගය මත බද්ද | 217,686,923,042 | 204,656,032,805 | 6.37 |
| භාණ්ඩ හා සේවා බද්ද | 15,976,746 | 11,994,674 | 33.20 |
| පිරිවැටුම් බද්ද | 218,080,060 | 138,260,169 | 57.73 |
| ජාතික ආරක්ෂක බද්ද | 2,149,612 | 3,930,354 | -45.31 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 750,907,497 | 709,648,933 | 5.81 |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද | 59,397,332,038 | 57,105,793,114 | 4.01 |
| මුද්දර බද්ද | 6,884,387,291 | 6,535,304,353 | 5.34 |
| ඉඩම් බද්ද | 96,741,230 | - | 0.00 |
| **සමාජ වගකීම් බද්ද** | 32,106,064 | 127,218,990 | -74.76 |
| **මුළු ආදායම් එකතුව** | **492,539,431,267** | **443,455,765,090** | **11.07** |



### 2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම.

2011 අයවැය යෝජනාවලට අනුකූලව පනවා ඇති අදාළ ව්‍යවස්ථා සම්පාදනයන් ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් රැස්කරනු ලබන පහත සඳහන් බදු පළාත් සභාවලට මාරු කරන ලදි.

| | |
|---|---|
| ජාතිය ගොඩනැගීමේ බදු | රැස්කිරීම් වලින් 33.33% ක් |
| මුද්දර බදු | රැස්කිරීම් වලින් 100% ක් |

පළාත් සභාවලට මාරුකරන ලද මුදල සහ දෙපාර්තමේන්තුව විසින් අදාළ බදුවල මුළු රැස්කිරීම් ප්‍රමාණය 04 වන වගුවේ දැක්වේ.

| වගුව 04:- පළාත් සභාවලට බදු ආදායම් මාරු කිරීම -2013 | | |
|---|---|---|
| | මුළු එකතුව (රු.) | පළාත් සභාවලට මාරු කළ ප්‍රමාණය (රු.) |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 59,397,332,038.00 | 18,460,661,347.00 |
| මුද්දර බද්ද | 6,884,387,290.00 | 6,884,387,290.00 |

### 2.6 ආදායම් රැස් කිරීම් – ස්ව තක්සේරු පදනම සහ අනෙකුත්

වසර තුළ රැස්කරන ලද සමස්ථ ආදායමෙන් (ආනයන මත එකතු කළ අගය මත බදු හා ආනයන මත ජාතිය ගොඩනැගීමේ බදු හැර) ස්වතක්සේරු යටතේ ගෙවීම් සමස්ථ වටිනාකමට සම්පූර්ණයෙන්ම වාගේ දායකත්වය ලබා දුනි. තවද නිල තක්සේරු ආකාරයෙන් ආදායම් රැස්කිරීම මුළු එකතුවෙන් 4% ක් පමණක් විය. ස්වතක්සේරු පදනම යටතේ ආදායම් රැස්කිරීම සඳහා තම මෙහෙවරෙහි ප්‍රධාන කොටස ලෙස ස්වේච්ඡා බදු අනුකූලතාවය දිරිගැන්වීම පිණිස ගන්නා ලද ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වය මෙයින් පිළිබිඹු වේ. මේ සම්බන්ධයෙන් ගන්නා ලද අවශ්‍ය ක්‍රියාමාර්ග සහ පහසුකම් මෙම සාර්ථකත්වය සඳහා අඛණ්ඩව දායක විය. මේ පිළිබඳ සංසන්දනාත්මක අගයයන් 05 වගුවෙහි දක්වා ඇත.

| වගුව 05 :- ස්වයං තක්සේරු පදනම සහ වෙනත් රැස්කිරීම් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2011 (රු.'000) | | 2012 (රු.'000) | | 2013 (රු.'000) | |
| | ස්වතක්සේරු | වෙනත් | ස්වතක්සේරු | වෙනත් | ස්වතක්සේරු | වෙනත් |
| ආදායම් බද්ද | 130,990,294 | 4,983,219 | 152,640,354 | 5,088,549 | 189,657,462 | 9,412,569 |
| එකතු කළ අගය මත බද්ද (ආනයන මත එ.අ.බ.හැර) | 98,826,247 | 4,283,614 | 101,816,629 | 3,370,532 | 117,622,485 | 3,474,351 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (ආනයන මත ජා.ගො.බ.හැර) | 27,950,249 | 609,927 | 30,496,246 | 3,233,290 | 35,840,240 | 1,113,648 |
| වෙනත් | 38,132,720 | 802,937 | 23,485,987 | 479,049 | 15,849,578 | 535,568 |
| **එකතුව** | **295,899,510** | **10,679,697** | **308,439,216** | **12,171,420** | **358,969,765** | **14,536,136** |
| සමස්ත ආදායමට % (ආනයන මත එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද හැර) | 96.52% | 3.48% | 96% | 4% | 96% | 4% |

## 2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය


2013 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් 06 වන වගුවෙන් පෙන්වයි. මෙම දායකත්වයන් 04 වන සටහනින් නිරූපණය කරයි. 2013 වසරේ රාජ්‍ය ආදායම රුපියල් මිලියන 1,137,447 (මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව) දක්වා වැඩි වී ඇත්තේ රාජ්‍ය ආදායමට මුළු දේශීය ආදායම රැස්කිරීම් වල ප්‍රතිශතය 43.30% ලෙස වාර්තා කරමිනි.

ආර්ථිකය සංවර්ධනය කිරීමේ අරමුණ; යටිතල පහසුකම් සංවර්ධන අවස්ථා, උසස් තාක්ෂණයෙන් යුත් පිරියත හා යන්ත්‍ර භාවිතය, බල ශක්ති ජනනය නව තාක්ෂණය හඳුන්වාදීම වර්ධනය කිරීම සහ යහපත් ගෙවුම් ශේෂයක් සඳහා අපනයන දිරි ගැන්වීම යනාදිය ඇතුළු සුවිශේෂී ආර්ථික සහ වාණිජ කටයුතු දිරිමත් කරනු ලැබීම සහ පහසු කිරීම ඇතුළත් සාර්ව ආර්ථික ප්‍රතිපත්තියක් සඳහා යොමුවේ. බදු සඳහා දිරි දීමනා, විරාම, නිදහස් කිරීම් සහ සහනාදායී බදු අනුප්‍රමාණයන් ඇතුළු අනෙකුත් දිරිගැන්වීම් සහිතව මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා මෑත කාලීන බදු ප්‍රතිපත්තිය මගින් තීරණාත්මකව හා අඛණ්ඩව ක්‍රියාත්මක වීමේ දී සැලකිය යුතු ආර්ථික කටයුතු ප්‍රමාණයක් බද්දට යටත් නොවේ. මෙය ප්‍රතිශතන් පහළ යාමේ ප්‍රවණතාවයට හේතුවක් විය හැකිය.

වගුව 06:- ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය

| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස් කිරීමේ % (ප්‍රතිශතය) | ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ දළ ජාතික නිෂ්පාදන රු. මිලියන * | දළ ජාතික නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2009 | 699,643 | 353,015 | 50.46% | 4,835,293 | 7.30% |
| 2010 | 817,280 | 422,512 | 51.69% | 5,604,104 | 7.54% |
| 2011 | 934,812 | 443,830 | 47.48% | 6,544,009 | 6.78% |
| 2012 | 987,844 | 443,456 | 44.89% | 7,582,376 | 5.85% |
| 2013 | 1,137,447 | 492,539 | 43.30% | 8,673,870 | 5.68% |

මූලාශ්‍රය –*මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (වාර්ෂික වාර්තාව) **ශ්‍රී ලංකා මහ බැංකුව (වාර්ෂික වාර්තාව)



## 2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය

ආදායම් වාර්තා නිසි වේලාවට සැපයීම මගින් සහ ස්ව තක්සේරු මත පදනම්ව බදු ගෙවීම සඳහා බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වැඩිදියුණු කිරීමේ වැඩ සටහන් වර්ෂය පුරා ක්‍රියාත්මක විය. වරප්‍රසාද කාඩ්පත් ලබාදීම, (රන් සහ රිදී කාඩ්පත්) මෝටර් රථ ආනයන මත බදු සහන ප්‍රදානය කිරීම, කලින් ගෙවීම් කරන බදු සම්බන්ධයෙන් වට්ටම් ලබාදීම වැනි බදු නීතීන් කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාවය ඉහළ නැංවීම පිණිස තනි පුද්ගල බදු ගෙවන්නන් සඳහා ප්‍රතිලාභ ප්‍රදානය කිරීම අඛණ්ඩව සිදු කරන ලදි.

ඒ අනුව, 2012/2013 තක්සේරු වර්ෂය තුළ දී නියමිත දින සංස්ථාපිත අංශයේ ආදායම් බදු වාර්තා සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය 56% ක් වූ අතර, නියමිත දිනෙන් එක් මසක් තුළ එය 70% දක්වා ඉහළ ගොස් ඇත. නියමිත දිනෙන් මාස දෙකකට පසුව අනුකූලතා අනුප්‍රමාණය සංස්ථාපිත අංශයේ 75.5% ක් විය. සංස්ථාපිත නොවන අංශය සම්බන්ධයෙන්, එය නියමිත දිනට 41% ක් වූ අතර, නියමිත දිනෙන් එක් මසක් තුළ එය 54% ක් විය. නියමිත දිනෙන් මාස දෙකක් තුළ අනුකූලතා අනුප්‍රමාණය සංස්ථාපිත නොවන අංශයෙහි 60% ක් විය.

07 වන වගුවෙන් 2008/2009 සිට 2012/2013 වසර දක්වා නියමිත දිනට සහ නියමිත දින සිට එක් මසක් තුළ ආදායම් බදු වර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය පෙන්වයි. අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතා අනුප්‍රමාණයන් 08 වන වගුවෙන් පෙන්වයි.

**වගුව 07 :- ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතාවය 2008/09 සිට 2012/2013 දක්වා**

| තක්සේරු වර්ෂය | අංශය | නියමිත දිනට අනුකූලතාවය | නියමිත දින සිට මාසයක් තුළ අනුකූලතාවය |
|---|---|---|---|
| 2008/2009 | සංස්ථාපිත | 49% | 58% |
| | සංස්ථාපිත නොවන | 39% | 48% |
| 2009/2010 | සංස්ථාපිත | 52% | 66% |
| | සංස්ථාපිත නොවන | 41% | 53% |
| 2010/2011 | සංස්ථාපිත | 56% | 68% |
| | සංස්ථාපිත නොවන | 42% | 59% |
| 2011/2012 | සංස්ථාපිත | 56% | 60% |
| | සංස්ථාපිත නොවන | 39% | 48% |
| 2012/2013 | සංස්ථාපිත | 56% | 70% |
| | සංස්ථාපිත නොවන | 41% | 54% |

**වගුව 08 :- අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතාවය**

| | එකතු කළ අගය මත බදු | ආර්ථික සේවා ගාස්තු | ජාතිය ගොඩනැගීමේ බදු | උපයන විට ගෙවීම් | |
|---|---|---|---|---|---|
| වසර 2011 | 94% | 85% | 89% | තක්සේරු වර්ෂ 2010/11 | 63% |
| වසර 2012 | 89% | 80% | 79% | තක්සේරු වර්ෂ 2011/12 | 52% |
| වසර 2013 | 78% | 99% | 77% | තක්සේරු වර්ෂ 2012/13 | 53% |

## 2.9 ආදායම් බදු රැස්කිරීම

ආදායම් බදු මගින් ආදායම් උත්පාදනය; එනම් සංස්ථාපිත ආදායම් බදු, පුද්ගල ආදායම් බදු, පොළී මත ලාභාංශ බදු සහ රඳවාගැනීමේ බදු වලින් ආදායම් රැස් කිරීම 2013 වසරේ දී රුපියල් මිලියන 199,070 දක්වා වැඩි වී ඇත. 2012 වසරේ පැවති රුපියල් මිලියන 157,728 ට සාපේක්ෂව එය 26.21% ක වැඩිවීමකි. වර්ෂයේ මුළු ආදායම් බදු රැස්කිරීම, දෙපාර්තමේන්තුවේ මුළු ආදායමෙන් 40% ක් වන අතර, එය 2012 වසරේ 36.20% ක් විය.

### 2.9.1 ආදායම් බදු රැස්කිරීම - ආංශීය වශයෙන් පැහැදිලි කිරීම.

මුළු ආදායම් බදු රැස්කිරීම සඳහා සංස්ථාපිත අංශයෙන් ලද දායකත්වය රුපියල් මිලියන 94,053 ක් හෙවත් එකතු කරන ලද මුළු බදු ප්‍රමාණයෙන් 47% ක් ( රුපියල් මිලියන 199,070 ක්) විය. සංස්ථාපිත නොවන අංශයේ දායකත්වය රුපියල් මිලියන 105,016 ක් හෙවත් 53% කි.


අංක 9 වගුව මගින් එහි සංයුතිය පෙන්වන අතර, එය 05 වන සටහනෙන් නිරූපණය කරයි.

වගුව 09 : - සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස් කිරීම් - 2012 සහ 2013

| | 2013 | | 2012 | |
|---|---|---|---|---|
| | බදු රැස් කිරීම (රු.) | % | බදු රැස් කිරීම (රු.) | % |
| සංස්ථාපිත * | 94,053,497,550.00 | 47% | 77,054,016,253.00 | 49% |
| සංස්ථාපිත නොවන** | 105,016,533,154.00 | 53% | 80,674,886,650.00 | 51% |
| එකතුව | **199,070,030,704.00** | **100%** | **157,728,902,903.00** | **100%** |

සටහන * 2012 වසරේ රු. මිලියන 8, 712 ක සහ 2013 වසරේ රුපියල් මිලියන 9,767 ක ලාභාංශ බදු ඇතුළත් ය.

** පොළී ආදායමෙන් සංස්ථාපිත අංශය විසින් ඉවු කරන ලද සේවාවන්ගෙන් අඩු කරන ලදුව, ප්‍රේෂණය කරන ලද රඳවා ගැනීමේ බදු සහ උපයන විට ගෙවීමේ (PAYE) ක්‍රමය යටතේ සේවානියුක්තීන් විසින් ගෙවන ලද ආදායම් බද්ද ඇතුළත් ය.



### 2.9.2 ආදායම් බදු රැස්කිරීමේ ප්‍රභවමය වශයෙන් විශ්ලේෂණය

වසර තුළ රැස්කරන ලද ආදායම් බදුවල ප්‍රභවමය වශයෙන් සංයුතිය අංක 10 වැනි වගුවෙන් පෙන්වයි.

| වගුව 10 :- ආදායම් බදු රැස් කිරීම - 2013 | | |
|---|---|---|
| ප්‍රභවය | බදු රැස් කිරීම (රු.මිලියන) | |
| **සේවා නියුක්තිය** | | |
| උ.වි.ගෙ.ක්‍රමය | 18,850.77 | |
| පැහැර හරින ලද බදු සමඟ දණ්ඩන තක්සේරු කිරීම් | 83.33 | **18,934.10** |
| **වෙනත්** | | |
| ස්ව තක්සේරු සහ දණ්ඩන සමග තක්සේරු කිරීම් | 92,832.93 | |
| පොළී මත රඳවාගැනීමේ බදු, වාර්ෂික ගෙවීම් මත අඩුකිරීම්, රාජ්‍යභාග හෝ කළමනාකරණ ගාස්තු | 77,940.51 | |
| ප්‍රභවයේදී අනෙකුත් අඩු කිරීම් | 9,962.92 | |
| **දළ බදු රැස්කිරීම** | | **180,736.36** |
| අඩු කළා : ආපසු ගෙවීම් | | (600.43) |
| **ශුද්ධ රැස් කිරීම්** | | **199,070. 03** |

රඳවාගැනීමේ බදු යාන්ත්‍රණය යටතට නොගැනෙන වෙළෙඳාම්, ව්‍යාපාර, වෘත්තීය, රැකියා සහ වෙනත් සේවා මත බදු ඇතුළුව ස්වතක්සේරු හා දණ්ඩන සමඟ තක්සේරු ආකාරයෙන් රැස්කිරීම් රු.92,833/- කි.

### 2.9.3 ආදායම් බද්දට අදාළව වර්ෂය තුළ සිදුකර ඇති ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්:

සමාලෝචනයට බඳුන්කරන වර්ෂය තුළ, අය වැය මගින් ප්‍රකාශිත පරිදි බදුකරණ යෝජනා සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස දේශීය ආදායම් පනතට පහත සඳහන් වෙනස්කම් සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

<u>**බදු නිදහස් කිරීම්**</u>

I. පහත සඳහන් ආයතනයන්හි යම් ලාභ සහ ආදායම් (ලාභාංශ හා පොළී හැර) ආදායම් බද්දෙන් නිදහස් කරන ලදි.

- 1974 අංක 26 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය.
- 1996 අංක 17 දරන ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය.
- ඒකාබද්ධ අරමුදලින් පාර්ලිමේන්තුව විසින් වෙන්කරනු ලබන අරමුදලින් හෝ රජය මගින් පහසුකම් සලසනු ලබන යම් ණය මුදලකින් නොමිලේ සේවා සලසන ප්‍රමාණයට යම් රාජ්‍ය සංස්ථාවක්.
- ජාතික සංවර්ධන භාර අරමුදල සමඟ ඒකාබද්ධ කරනු ලබන ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව.
- ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

II. පහත සඳහන් ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදි.

(අ) එක් රටක සිට වෙනත් රටකට භාණ්ඩ අපනයනය කිරීමෙන් උපයන ලාභ (ශ්‍රී ලංකාව හැර)

(ආ) සමාගම් පනත යටතේ පිහිටුවා නොමැති සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නියම කරන ලද රජයේ චක්‍රලේඛය සහ එම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව ක්‍රියා කිරීම අනිවාර්ය කෙරෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති යම් රජයේ ආධාර ලබන පෞද්ගලික පාසල්වල ලාභාංශ ආදායම.

(ඇ) පෙන්ද්‍රීය (කාබනික) පොහොර සහ පලිබෝධ නාශක නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හෝ විකිණීමෙන් උපයන ලාභ.

(ඈ) දේශීය ආදායම් පනතේ 17 අ වගන්තිය හෝ 16 ඇ වගන්තිය යටතේ බදු විරාම කාලය තුළ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගමක් විසින් යම් විදේශ සහායකයකුට කරනු ලබන සැලසුමක් සඳහා රාජ්‍ය භාග, සාමාජික ගාස්තු හෝ ගෙවීම්, ශ්‍රී ලංකාවෙන් පිටත දී විදේශ සෘජු ආයෝජන උද්ගත වන විට, එම කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත ආයෝජන මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි එම සේවා,

ශ්‍රී ලංකාවේ දී ක්‍රියාකාරකම් කරගෙන යාම අත්‍යවශ්‍ය, සහ
ශ්‍රී ලංකාවේ දී ලබාගත නොහැකි වන්නේ නම්,

(ඉ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් බලපත්‍ර ලබාදෙනු ලබන යම් ව්‍යාපාර වස්තු හුවමාරු මධ්‍යස්ථානයක මිල සඳහන් කරන ලද (රඳවාගැනීමේ බදු අඩුකිරීම ඇතුලුව) සංස්ථාපිත ණය සුරැකුම්පත්හි කරන ලද ආයෝජනයෙන් උපයන පොළී ආදායම.

(ඊ) මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව (රඳවාගැනීමේ බදු අඩුකිරීම ඇතුලුව) නිකුත් කරන ලද යම් නගර සභා බැඳුම්කරයකින් උපයන පොළී ආදායම.

(උ) විශේෂඥ නිල පඩිනඩි

දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ 1 වන උපවගන්තියේ (ඇඇ) ඡේදයේ අර්ථානුකූලව විශේෂඥයකු වන සහ ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සහ දේශීය ආදායම් පනතේ 17 අ වගන්තිය හෝ 16 ඇ වගන්තිය යටතේ බදු විරාම කාලපරිච්ඡේදය තුළ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගමක් විසින් ශ්‍රී ලංකාවට ගෙන්වන ලද යම් තැනැත්තෙකුගේ ශ්‍රී ලංකාවේ දී උද්ගත වන පඩිනඩි වලින් උපයන ආදායම, කරනු ලබන මුළු ආයෝජනය විදේශ සෘජු ආයෝජනයෙන් එ.ජ.ඩො. මිලියන 50 ඉක්මවන විට, මෙම කාර්යය සඳහා කරන ලද ඉල්ලීම මත ආයෝජන මණ්ඩලය විසින් නිශ්චය කරන ලද පරිදි එම සේවා සමාගමේ ක්‍රියාකාරකම් ඉටු කිරීමෙහි ලා අත්‍යවශ්‍ය වන්නේ නම්,

(ඌ) බැඳුම්කරවල ආයෝජනය කිරීමෙන් උපයන පොළිය.

(එ) කෘෂිකාර්මික ඉඩම්වල පුනර්ජනනීය බලශක්ති භෝග වගා කිරීමෙන්උපයන ලාභ.

(ඒ) ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයන ශ්‍රී ලාංකික පුරවැසියෙක්.

- ශ්‍රී ලංකාවේ වාසිකයකු වන සහ පුරවැසියකු වන යම් පුද්ගලයකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත යම් ප්‍රභවයකින් උපදවන ලාභ සහ ආදායම, එම ආදායම ශ්‍රී ලංකාවේ බැංකුවක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම් ආදායම් බද්දෙන් නිදහස් කරන ලදි.

- දේශීය ආදායම් පනතේ 15 වන වගන්තියේ සඳහන් ශ්‍රී ලංකාවට පැමිණ නවාතැන් ගන්නා ද්විත්ව පුරවැසිභාවය ලද පුරවැසියනට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයන ලාභ සහ ආදායම මත නිදහස් කිරීම, ශ්‍රී ලංකාවේ හෝ යම් වෙනත් රටක පුරවැසිභාවය ලබාගන්නා එම පුද්ගලයා වෙනත් යම් රටක ස්ථිර වාසික තත්ත්වය හෝ ඊට සමාන තත්ත්වයක් ලබාගෙන ඇති තැනැත්තන්ට ද (විස්තෘත) ව්‍යාප්ත කෙරේ.

(දේශීය ආදායම් පනතේ 79(3) වගන්තියේ නිදහස් දින 365 ක අඛණ්ඩ කාලපරිච්ඡේදයක් සඳහා ඔහු ශ්‍රී ලංකාවේ නොසිටීම මත පදනම්ව යම් පුද්ගලයෙකුගේ වාසිකභාවය තීරණය කිරීමේ රීතිය ඉවත් කරන ලදි. ඒ අනුව, දින 183 රීතිය පමණක් වාසිකත්වය තීරණය කිරීමේ දී අදාළ වේ.

(ඕ) විදේශ සේවානියුක්තියක සිට ආපසු පැමිණ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ඔහුගේ/ඇයගේ ඉතුරුම් ආයෝජනය කරන යම් පුද්ගලයකු වසර 5 ක කාලපරිච්ඡේදයක් සඳහා එම සියලු ව්‍යාපාරවල පිරිවැටුම මත සහ ලාභාංශ ආදායම මත ගෙවිය යුතු සියලු බදු වලින් නිදහස් කරන ලදි.

<u>සහනදායී බදු අනුපාතයන්</u>

i. ඒකක භාර කළමනාකරණ සමාගම් සම්බන්ධයෙන් අදාළ බදු අනුප්‍රමාණය 10% දක්වා අඩු කරන ලදි.

ii. 40 අ වගන්තියේ සඳහන් නියමුවන් විසින් සේවා නියුක්තියෙන් උපයන සහ 40 ආ වගන්තියේ සඳහන් සුදුසුකම්ලත් සේවා නියුක්තයන් උපයන ලාභ 16% උපරිම අනුප්‍රමාණයක් දක්වා අඩු කරන ලදි.

iii. සියලු සේවානියුක්තයට සමානව අදාළ නොවන සේවා නියුක්තිය අහිමිවීම වෙනුවෙන් වන්දි මුදලක් වන සේවා නියුක්ත ආදායම මත අදාළ ආදායම් බද්දේ උපරිම අනුප්‍රමාණය 16% දක්වා අඩු කරන ලදි.

iv. කුකුළු ගොවිපොළකින් උපයන ලාභ මත බදු අනුප්‍රමාණය 10% දක්වා අඩු කරන ලදි.

v. විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබෙන විදේශ නැව් සඳහා (නැවේ පරිභෝජනය සඳහා විය හැකිය.) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සැපයීමෙන් හෝ සේවා සැලසීමෙන් උපයන ලාභ සහ ආදායම සඳහා 12% ක අනුප්‍රමාණයක් යටතේ බදු අය කරනු ලැබේ.

vi. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය ලබාදෙන ලද ගිණුමක විදේශ විනිමය ඉපයීම් මගින් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත යම් නිෂ්පාදනයක් විකිණීමෙන් උපයන ලාභ සහ ආදායම් සඳහා 12% අනුප්‍රමාණය යටතේ බදු අය කරනු ලැබේ.

vii. ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි අපනයනාභිමුඛ ව්‍යවසායක් මගින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ විකිණීම.

- දේශීය ආදායම් පනතේ 16 ඇ, 17 අ සහ 16 ඈ වගන්තිය හෝ ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ බදු විරාමය භුක්ති විඳින සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලය තුළ එකී ආයෝජන මණ්ඩල ගිවිසුමේ විධිවිධාන යටතේ බදු නිදහස් පදනම මත ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ හෝ අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා අවසරලත් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි යම් ව්‍යවසායක්.
- යම් රජයේ බලධරයෙකු යටතේ බදු නිදහස් පදනම මත නිශ්චිත භාණ්ඩ ආනයනය කිරීම සඳහා සුදුසුකම් ලත් යම් තැනැත්තෙකු;

බදු කාර්යයන් සඳහා ආනයන ප්‍රතිෂ්ඨාපනය ලෙස ආයෝජන මණ්ඩලය විසින් අනුමත ප්‍රමාණය දක්වා එම භාණ්ඩ නිෂ්පාදකයාගේ උද්දේශිත අපනයන ලෙස සැලකේ.

viii. "කාබනික තේ තොග" 12% සහනදායී අනුප්‍රමාණය අදාළ කරගැනීම සඳහා සම්ප්‍රදායික නොවන භාණ්ඩ ලෙස වර්ග කරන ලදි.

ix. 59 ආ වගන්තියේ සඳහන් රු. මිලියන 300 වාර්ෂික පිරිවැටුම 10% සහනදායී අනුප්‍රමාණය අදාළ කරගැනීම සඳහා රු. මිලියන 500 දක්වා ප්‍රතිශෝධනය කරන ලදි.

x. යම් කුඩා ජලවිදුලි ව්‍යාපෘතියක් හෝ වෙනත් විකල්ප බලශක්ති මූලාශ්‍රයක් ක්‍රියාත්මක කරවීමෙන් යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් උපයන ලාභ සහ ආදායම සඳහා 10% සහනදායී අනුප්‍රමාණය යටතේ බදු අය කරනු ලැබේ.

xi. 2013.04.01 දින හෝ එදිනට පසුව ලැයිස්තුගත කරන ලද හෝ එම සමාගමේ කොටස් පොදු ජනතාවට නිකුත් කර ඇති යම් සමාගමක් විසින් ගෙවිය යුතු බද්ද එම කොටස් ලැයිස්තුගත කරනු ලබන තක්සේරු වර්ෂයක් සඳහා, සහ එම තක්සේරු වර්ෂයෙන් පසු ආසන්නතම තක්සේරු වර්ෂ 2 ක් සඳහා 50% කින් අඩු කරන ලදි.

**ලාභ සහ ආදායම් නිශ්චය කිරීම**

i. යම් පිරියතක යන්ත්‍ර හෝ උපකරණ (2013 අප්‍රේල් 1 වන දින හෝ එදිනට පසුව අත්පත් කර ගන්නා ලද) අත්පත් කරගැනීමේ පිරිවැය සඳහා -

- තාක්ෂණය ඉහළ නැංවීමේ කාර්යයන් හෝ නව තාක්ෂණ හඳුන්වාදීම සඳහා වර්ෂයකට 50% අඩු කිරීමට ඉඩදෙන ලදි.
- විකල්ප බලශක්ති සම්පත් වලින් විදුලිබල ජනනය කිරීමේ පූර්ණ අවශ්‍යතාවයෙන් 30% කට වඩා සපයනු ලබන බලශක්ති කාර්යක්ෂමතා කාර්යයන් සඳහා පූර්ණ වශයෙන් අඩු කිරීම සඳහා ඉඩ ලබාදෙන ලදි.

- ආපදා කළමනාකරණ ක්‍රමයට අදාළ CSE අවශ්‍යතාවනට අනුකූලව Broker Back office පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා පූර්ණ වශයෙන් අඩු කිරීම සඳහා ඉඩ ලබාදෙන ලදි.
- යම් අපනයන කර්මාන්තයක් සඳහා වර්ෂයකට 50% යටතේ අඩු කිරීමට ඉඩ ලබාදෙන ලදි.

ii. **රජය විසින් අයකරන ලද විශේෂ ගාස්තු**

රජයට විශේෂ ගාස්තුවක් ලෙස රාජ්‍ය සංස්ථාවක් හෝ රජය සතු ව්‍යාපාරයක් විසින් ගෙවන ලද යම් මුදලක් සඳහා අඩු කළහැකි වියදමක් ලෙස ඉඩ ලබාදෙන ලදි

iii. **පර්යේෂණ සහ සංවර්ධන වියදම්**

රජයේ ආයතන මගින් පවත්වාගෙන යනු ලබන පර්යේෂණ සහ සංවර්ධනය සම්බන්ධයෙන් වියදම් සඳහා ඉඩ ලබාදෙනු ලබන තෙවදැරුම් අඩු කිරීම් පෞද්ගලික ආයතන මගින් පවත්වාගෙන යනු ලබන පර්යේෂණ සම්බන්ධයෙන් එලෙස දරනු ලබන වියදම් සඳහා ද විස්තෘත (ව්‍යාප්ත) කරන ලදි.

iv. **වෙළෙඳ දැන්වීම් වියදම්**

ක්‍රීඩා අමාත්‍යාංශය මගින් අනුමත කරන ලද අන්තර්ජාතික ක්‍රීඩා තරඟවල දී විශේෂ අනුග්‍රහය ලබාදීම වෙනුවෙන් වෙළෙඳ දැන්වීම් වියදම් (25%) අඩු කිරීම මත සීමාකිරීම ඉවත් කරන ලදි. (2012 අගෝස්තු 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි)

**පොළී ආදායම මත රඳවාගැනීමේ බද්ද**

සංස්ථාපිත හර සුරැකුම්පත් මත පොළී ආදායම සම්බන්ධයෙන්, ආදායම් බද්දෙන් නිදහස් නො කෙරේ.

(අ) සමාලෝචනයට බඳුන් කරන එක් එක් කාලපරිච්ඡේදය ආරම්භවන අවස්ථාවේ දී නිකුත් කරන විට අදාළ කාලපරිච්ඡේදය වෙනුවෙන් හෝ සුරැකුම්පත පාවෙන පොළී අනුපාතයකට නිකුත් කරන අවස්ථාවේ දී අඩු කිරීම පූර්ණ පොළිය මත වේ.

(ආ) අඩු කිරීම කළින් සිදුකර නොමැති විට, අඩු කිරීම පොළිය ගෙවන අවස්ථාවේ දීය. (2011 අප්‍රේල් 01 දින හෝ එදිනට පසුව ගෙවිය යුතු)

**කාල කඩඉම**

දෙවසරේ කාල කඩඉම් කාලපරිච්ඡේදය 2013 අප්‍රේල් 01 දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි මාස 18 ක කාලය දක්වා අඩු කරන ලදි.

**මිල පාලන ව්‍යවස්ථා සම්පාදනය**

(අ) ආශ්‍රිත ව්‍යවසායන්හි දේශීය ගනුදෙනුවල දී භාණ්ඩ හා සේවාවන්හි අසම්බන්ධිත මිල නිශ්චය කිරීම සඳහා වෙනම විධිවිධාන සකසන ලදි.

(ආ) කළින් මිල නියම කිරීමේ කටයුතු සඳහා විධිවිධාන හඳුන්වා දෙන ලදි.

## 2.10 එකතු කළ අගය මත බදු රැස් කිරීම


අදාළ වර්ෂය තුළ දී එකතු කළ අගය මත බදු (VAT) රැස්කිරීම රුපියල් මිලියන 217,686 ක් වූ අතර, එය වසර සඳහා ඇස්තමේන්තුගත රුපියල් මිලියන 255,353 ට වඩා රුපියල් මිලියන 36,367 ක අඩුවීමක් පෙන්වයි. කෙසේ වෙතත්, මෙම අගය කලින් වසරට වඩා රු. මිලියන 13,030 ක හෙවත් 6.37% ක වැඩිවීමකි. දේශීය සැපයුම් මත රැස් කරන ලද එ.අ.බ. කොටස පෙර වසරට වඩා තියුණු වැඩිවීමක් පෙන්වන අතර, වසර තුළ ආනයන මත රැස් කරන ලද එ.අ.බ. සඳහා අඩුවීමක් පෙන්වයි. වසර සඳහා රැස් කරන ලද මුළු දේශීයව එකතු කළ අගය මත බදු රුපියල් මිලියන 121,096 ක් වූ අතර, මෙම අගය 2012 වසරට වඩා රුපියල් මිලියන 15,909 ක වැඩි වීමකි. 2012 වසර තුළ ආනයනය මත රැස් කරන ලද මුළු එකතු කළ අගය මත බදු රුපියල් මිලියන 99,468 ක් වූ අතර, 2013 වසරේ දී එය රුපියල් මිලියන 96,590 ක් විය.

එකතු කළ අගය මත බදු ආංශික වශයෙන් දළ රැස්කිරීම, ආපසු ගෙවීම සහ ශුද්ධ රැස්කිරීම 11 වන වගුවෙන් පෙන්වන අතර, රැස්කිරීම් 06 වන සටහනෙන් නිරූපණය කරයි.

**වගුව 11 :- එකතු කළ අගය මත බදු දළ රැස් කිරීම් සහ ආපසු ගෙවීම්**

| අංශය | 2012 | | 2013 | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ශුද්ධ රැස් කිරීම (රු.මිලියන) | | දළ රැස් කිරීම (රු.මිලියන) | | ආපසු ගෙවීම | ශුද්ධ රැස් කිරීම (රු.මිලියන) | |
| නිෂ්පාදන අංශය | | 38,487.28 | | 44,071.51 | 352.77 | | 43,718.74 |
| නිෂ්පාදන නොවන අංශය | | | | | | | |
| සේවාව | 45,507.60 | | 56,256.74 | | 106.92 | 56,149.83 | |
| මූල්‍ය සේවාව | 21,090.80 | | 21,203.51 | | | 21,203.51 | |
| වෛකල්පිත එ.අ.බ. | 101.48 | 66,699.88 | 24.76 | 77,485.01 | | | 77,378.10 |
| ආනයන | | 99,468.87 | | 96,590.09 | | | 96,590.08 |
| **එකතුව** | | **204,656.03** | | **218,146.61** | **459.69** | | **217,686.92** |

**සටහන 06**
**එකතු කළ අගය මත බදු රැස්කිරීම – 2013**



එකතු කළ අගය මත බදු රැස්කිරීමේ ආංශික වර්ගීකරණය සහ දළ ජාතික නිෂ්පාදනයට දායකත්වය 12 වන වගුවෙන් පෙන්වයි.

**වගුව 12 :- දළ ජාතික නිෂ්පාදනයට එකතු කළ අගය මත බදු දායකත්වය ආංශික විශ්ලේෂණය**

| අංශය | 2012 | | 2013 | | දළ දේශීය නිෂ්පාදනයට එ.අ.බ. ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | ශුද්ධ රැස් කිරීම් (රු.මිලියන) | % | ශුද්ධ රැස් කිරීම් (රු.මිලියන) | % | 2012 | 2013 |
| නිෂ්පාදන අංශය | 38,487,278,292 | 18.81% | 43,718,740,385 | 20.08% | 0.51% | 0.50% |
| නිෂ්පාදන නොවන අංශය | 66,699,883,293 | 32.59% | 77,378,096,221 | 35.55% | 0.88% | 0.89% |
| ආනයන මත | 99,468,871,220 | 48.60% | 96,590,086,435 | 44.37% | 1.31% | 1.11% |
| එකතුව | **204,656,032,805** | **100.00%** | **217,686,923,041** | **100.00%** | **2.70%** | **2.50%** |

## 2.10.1 එකතු කළ අගය මත බදු කර්මාන්ත අනුව ව්‍යාප්තිය

13 වගුව මගින් බැංකු, රක්ෂණ, හෝටල් සහ ආපන ශාලා, ඉදිකිරීම්, විදුලිය, ගෑස්, ආනයනය සහ මූල්‍ය යනාදී වශයෙන් වර්ගීකරණය කරන ලද දේශීයව එකතු කළ අගය මත බදු සමස්ථ ආදායමට දී ඇති දායකත්වය පෙන්වා ඇත.

**වගුව 13 :- දළ දේශීය එකතු කළ අගය මත බද්ද - නිෂ්පාදන සහ සේවා අංශ**

| අංශය | 2011 (රු.මිලියන) | 2012 (රු.මිලියන) | පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමේ/වැඩිවීමේ ප්‍රතිශතය | 2013 (රු.මිලියන) | පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩුවීමේ/වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| බැංකු | 14,828 | 14,380 | -3.02% | 15,921 | 10.72% |
| රක්ෂණ | 4,207 | 4,456 | 5.92% | 4,882 | 9.56% |
| හෝටල් සහ ආපන ශාලා | 4,590 | 5,396 | 17.56% | 5,672 | 5.11% |
| ඉදිකිරීම් | 6,828 | 5,871 | -14.02% | 5,293 | -9.85% |
| විදුලිය සහ ගෑස් | 269 | 570 | 112% | 502 | -11.93% |
| ආනයන | 16,103 | 6,949 | -56.85% | 9,113 | 31.14% |
| මූල්‍ය | 11,072 | 10,576 | -4.48% | 11,860 | 12.14% |
| සංනිවේදන | 1,048 | 211 | -79.87% | 256 | 21.33% |
| ඛණිජ නිෂ්පාදන | 271 | 269 | -0.74% | 344 | 27.88% |
| පාන වර්ග - මද්‍යසාර | 8,877 | 9,043 | 1.87% | 9,747 | 7.79% |
| වර්ගීකරණය නොකළ සේවා | 7,291 | 7,633 | 4.69% | 7,916 | 3.71% |
| වර්ගීකරණය නොකළ නිෂ්පාදන | 7,588 | 7,105 | -6.37% | 9,517 | 33.95% |
| වෙනත් | 20,139 | 32,723 | 62.49% | 39,516 | 20.76% |
| එකතුව | **103,110** | **105,187** | **2.01%** | **120,538** | 14.59% |

## 2.10.2 <u>වසර තුළ එකතු කළ අගය මත බදුවලට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්</u>

**බදු සීමා වැඩිකිරීම:**

යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන සියලු ව්‍යාපාරයන්ගෙන් වාර්ෂික යටත් සැපයුම රු.මිලියන 12 නො ඉක්මවන යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයකි.

අදාළ වර්ෂය තුළ එකතු කළ අගය මත බදු පනතට පහත සඳහන් නිදහස් කිරීම් හඳුන්වා දෙන ලදි.

(අ) පහත සඳහන් ආයතන විසින් කරන ලද සැපයුම්.

- ශ්‍රී ලංකා මහ බැංකුව (මූල්‍ය සේවා මත එ.අ.බ. ඇතුළුව)
- රජය වෙනුවෙන්, රජය මගින් පහසුකම් සලසන ලද යම් ණය මුදලකින් නොමිලේ සේවා සැලසීමේ ප්‍රමාණයට යම් රාජ්‍ය සංස්ථාවක්.

(ආ) සැපයුම්:

- ඒකක භාර කළමනාකරණ සමාගම විසින් ඒකක භාරයකට සේවා සැපයීම.
- ක්‍රීඩාවට සම්බන්ධ යම් තරඟ කටයුත්තකට සහභාගිවීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන යම් ක්‍රීඩා තරඟයක යම් ක්‍රීඩකයකු, සංවිධායකයකු හෝ අනුග්‍රාහකයකුට ලබාදෙන හෝටල් පහසුකම් සැපයීම.
- පොල් වලින්, ඉවතලන දේ වලින්, දේශීයව නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන (පොල් ජීර්ණක, කොහු කෙඳි, වැඩුනු පැලම් (ලී) වගා මලු, කොහු ලනු, පොල්ලෙලි)
- ඓන්ද්‍රීය (කාබනික) පොහොර සහ පලිබෝධනාශක සැපයීම.

(ඇ) අමුද්‍රව්‍යයන් ආනයනය කිරීම හා සැපයීම

- සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 8704.23.10, 8704.23.20, 8704.32.10,8704.32.20 යටතේ බවුසර.
- ස.ව.ස අංක 84.29 යටතේ ඩෝසර්ස්, ග්‍රේඩර්, මට්ටම් යන්ත්‍ර, කැණීම් යන්ත්‍ර.
- ස.ව.ස. අංක 8705.30.10 යටතේ ගිනි නිවන රථවාහන.
- ස.ව.ස. අංක 8701.20.10 යටතේ අර්ධ ට්‍රැක්ටර් සඳහා මාර්ග ට්‍රැක්ටර්.
- ස.ව.ස. අංක 8543.90 යටතේ බලශක්ති සුරැකීමේවිදුලිබල්බ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යය

(ඈ) <u>තොග සහ සිල්ලර වෙළෙඳ ව්‍යාපාර සඳහා එකතු කළ අගය මත බදු පැනවීම:</u>

- තොග හෝ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් කරගෙන යන සහ රුපියල් මිලියන 500 ට වඩා අඩු නොවන කාර්තුමය පිරිවැටුමක්/සැපයුමක් (නිදහස් පිරිවැටුම/ සැපයුම ඇතුලුව) ඇති යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් මත එ.අ.බ. පනවන ලදි. කෙසේ වුවද, එ.අ.බ. යටත් සැපයුම් මත පමණක් අයකරනු ලැබේ.


(ඉ) යම් රෙදි හෝ ඇඟළුම්වල ගුණාත්මකභාවය, සංලක්ෂණය හෝ අගය වැඩිදියුණු කිරීමෙහි ලා උපකාරී වන සේවා මත අදාළ එ.අ.බ. නිදහස් කිරීම අපනයනය නොකරන අපනයකරුවන් සඳහා සලසන එම සේවා සඳහා සීමා කරන ලද අතර නූල් ආශ්‍රිත එම සේවා ආවරණය කෙරෙන පරිදි පුළුල් කරන ලදි.

## 2.11 ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම.

වසර සඳහා සමස්ථ ආදායමට ජාතිය ගොඩනැගීමේ බදු දායකත්වය රුපියල් මිලියන 59,397 ක් විය. මුළු ජාතිය ගොඩනැගීමේ බදු ආදායමෙන් රුපියල් මිලියන 18,460 ක් පළාත් සභා සඳහා මාරු කරන ලදි. ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි වී සිටි මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව 2013.12.31 දිනට 20,480 ක් විය. බද්දට යටත් පිරිවැටුම කාර්තුවකට රු.මිලියන 3 දක්වා වැඩි වූ හෙයින් එම සීමාවට අඩු තැනැත්තන් ලියාපදිංචි කිරීම වසර තුළ දී අවලංගු කරන ලදි.

| වගුව 14 :- ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම් විශ්ලේෂණය - 2013 | | |
|---|---|---|
| අංශය | ශුද්ධ රැස් කිරීම් (රු.) | |
| | 2012 | 2013 |
| නිෂ්පාදන | 11,617,896,700 | 16,418,159,594 |
| සේවා | 22,111,639,351 | 20,535,728,568 |
| ආනයන | 23,376,257,063 | 22,443,443,876 |
| **එකතුව** | **57,105,795,114** | **59,397,332,038** |

| වගුව 15 :- ඇස්තමේන්තුව සමග ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම රු. | ආදායම් රැස්කිරීම රු. | % |
| 2013 | 73,173,000,000 | 59,397,332,038 | 81% |
| 2012 | 65,629,785,000 | 57,105,793,114 | 87% |




### 2.11.1 ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළව සිදුකරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්:

අයවැය මගින් යෝජිත පරිදි ජාතිය ගොඩනැගීමේ බදු පනතට පහත සඳහන් වෙනස්කම් සිදු කරන ලදි.

**බදු සීමාව වැඩි වීම:**

යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන සියලු ව්‍යාපාරික කටයුතු වලින් රු.මිලියන 12 නොඉක්මවන වාර්ෂික යටත් සැපයුම් ඇති යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක්.

**නිදහස් කිරීම් :**

(අ) ස.වි.ස අංක 7610.90.10, 8501.31.10, 8541.40, 8513.10.10, 9405.10.20, 9405.20.20, 9405.40.40, 9405.50.20, 9032.89.10 සහ 8539.31.20 යටතේ සූර්යබල ශක්තිය ජනනය කිරීම සඳහා Solr panel modules, උපාංග හෝ Solar home systems.

(ආ) ස.වි.ස. අංක 2701.11, 2701.12 සහ 2701.2 යටතේ ගල් අඟුරු.

(ඇ) මුදල් අමාත්‍යාංශය මගින් අනුමත කරන ලද යම් අන්තර්ජාතික ක්‍රීඩා තරඟයක් සඳහා භාණ්ඩ ආනයනය කිරිම.

(ඈ) සකසන ලද මැණික් ලෙස එම මැණික් පසුව යම් විකිණීම් ඇතුළුව රේගු ආඥාපනතේ (235 වන අධිකාරිය) 6 අ වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයන් යටතේ විශේෂ සේවා ගාස්තු වලට යටත් ආනයනය කරන ලද මැණික්.

(ඉ) පහත සඳහන් පිරිවැටුම ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා යටත් නොවේ.

- ශ්‍රී ලංකා මහ බැංකුව
- රජය වෙනුවෙන්, ඒකාබද්ධ අරමුදලක් පාර්ලිමේන්තුව විසින් වෙන්කරනු ලබන අරමුදලකින් නොමිලේ හෝ රජය මගින් යම් ණය පහසුකම් ලබාදීමෙන් සේවා සලසන ප්‍රමාණයට යම් රාජ්‍ය සංස්ථාවක්.


(ඊ) ජෛන්ද්‍රීය (කාබනික) පොහොර සහ පලිබෝධනාශක සැපයීම.

## 2.12 ආර්ථික සේවා ගාස්තු රැස් කිරීම

අදාළ වර්ෂය තුළ රුපියල් මිලියන 6,595 ක් ආර්ථික සේවා ගාස්තු ලෙස රැස්කරන ලද අතර, සමස්ථ රැස්කිරීම් සඳහා දායකත්වය 1.0% ක් විය. එය වසර සඳහා ඇස්තමේන්තුවේ 51.68% කි. ආදායම් බද්දට යටත් ව්‍යාපාර සඳහා ආර්ථික සේවා ගාස්තු බැඳියාව ඉවත් කිරීම සහ බද්දට යටත් පිරිවැටුමේ සීමාව රු. මිලියන 25 සිට රු. මිලියන 50 දක්වා පුළුල් කිරීම හේතුකොටගෙන ආ.සේ. ගාස්තු රැස්කිරීම පහළ යාමේ ප්‍රවණතාවක් වර්ෂය තුළ දී දැකගත හැකිය.

**වගුව 16 :- ආර්ථික සේවා ගාස්තු රැස්කිරීම**

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම රු. | ආදායම් රැස්කිරීම රු. | % |
|---|---|---|---|
| 2013 | 12,763,000,000 | 6,595,600,863 | 52% |
| 2012 | 17,318,000,000 | 14,864,241,267 | 86% |



### 2.12.1. ආර්ථික සේවා ගාස්තුවට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

අයවැය යෝජනා සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස නිදහස් කිරීමේ ලැයිස්තුවට නිදහස් කිරීම් කිහිපයක් හඳුන්වා දෙන ලදි.

**නිදහස් කිරීම්**

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) යම් රජයේ සංස්ථාවක් විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සේවා සැලසීම සඳහා ඒකාබද්ධ අරමුදලින් රජය මගින් ලබාදෙන යම් ණය මුදලකින් පාර්ලිමේන්තුව විසින් ලබාදෙන අරමුදල්.

(ඇ) ඓන්ද්‍රීය පොහොර හෝ කෘෂි රසායන නිෂ්පාදනය කිරීම හෝ විකිණීමෙන් උපයන පිරිවැටුම.

### 2.13 උපයන විට ගෙවීමේ බදු රැස් කිරීම

උපයන විට බදු ගෙවීමේ ක්‍රමය යටතේ වර්ෂය තුළ දී එකතු කරන ලද දළ ආදායම 2012 වසරේ රුපියල් මිලියන 14,779 ට සාපේක්ෂව රුපියල් මිලියන 18,934 කි.

උපයන විට ගෙවීම් ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවානියුක්තින් සංඛ්‍යාව 297,240 ක් ලෙස වාර්තා වන අතර (ඇතැම් සේවායෝජකයින් විසින් සපයන ලද අසම්පූර්ණ ප්‍රකාශනවල සේවක සංඛ්‍යාව ඇතුළත් නොවේ.) උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ සේවායෝජකයින්ගේ සංඛ්‍යාව 11,778 කි.

**වගුව 17:- උපයන විට ගෙවීමේ බදු සහ ආදායම් මට්ටම් විශ්ලේෂණය කිරීම**

| ආදායම් පරාසය (රුපියල්) | | සමස්ත දළ පාරිශ්‍රමිකය (රුපියල්) | සේවා නියුක්තිකයින් සංඛ්‍යාව | උ.වි.ගෙ. යටතේ ගෙවන ලද බදු (රුපියල්) |
|---|---|---|---|---|
| 600,000 ට අඩු | බදු අඩු නොකළ | 105,801,524,007 | 599,380 | |
| | බදු අඩු කළ | 15,308,606,446 | 78,235 | 156,692,566 |
| 600,001-1,100,000 | | 76,307,380,239 | 106,082 | 956,252,427 |
| 1,100,001-1,600,000 | | 39,968,834,036 | 45,312 | 1,196,170,368 |
| 1,600,001-2,100,000 | | 18,890,054,347 | 10,572 | 973,516,297 |
| 2,100,001-2,600,000 | | 11,694,606,881 | 5,017 | 816,645,552 |
| 2,600,001-3,600,000 | | 16,454,070,299 | 4,632 | 1,330,162,783 |
| 3,600,000 ට වැඩි | | 43,791,786,128 | 18,801 | 10,550,372,635 |
| **එකතුව** | | **328,216,862,382** | **868,031** | **15,979,812,629** |

*සටහන : 2012/2013 තක්සේරු වර්ෂය මත පදනම්ව සේවා යෝජකයින් විසින් ඉදිරිපත් කළ සම්පූර්ණ කරන ලද වාර්තාවලට අනුව ඉහත තොරතුරු සපයා ඇත.*

## 2.14 රඳවාගැනීමේ බදු (පොළිය සහ නිශ්චිත ගාස්තු මත)

පොළිය මත රඳවාගැනීමේ බදු රැස්කිරීම වසර තුළදී රුපියල් 77,679,112,229 ක් වූ අතර, එකී රැස්කිරීම්වලින් රු.62,704,548,497 ක් රජයේ සුරැකුම්පත් වලින් ද (2012 වසර සඳහා රු.49,415,264,431), රු.14,978,900,177/- ක් මූල්‍ය ආයතනවලින් ද (2012 වසර සඳහා රු.8,790,601,147/-), ඉතිරිය අනෙකුත් උපකරණයන්ගෙන් ද ලැබුණි. පොළී මත රඳවාගැනීමේ බදු ආදායම පෙර වසරට වඩා රුපියල් මිලියන 18,417 ක වැඩිවීමක් පෙන්වයි.

නිශ්චිත ගාස්තු මත රඳවාගැනීමේ බදු ලෙස රු.254,908,743/- ක් රැස්කර ගන්නා ලදි. (එය 2012 වසරේ දී රු.344,211,910 කි.) නිශ්චිත ගාස්තු මත අදාළ රඳවාගැනීමේ බදු අඛණ්ඩව පවත්වා නොගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන්, නිශ්චිත ගාස්තු මත රඳවාගැනීමේ බදු ආදායම අඩු වී ඇත.


## 2.15 ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම.

වර්ෂය තුල ඔට්ටු හා සූදු බදු රැස්කිරීම රුපියල් 591,870,451/- ක් විය. වර්ෂය සඳහා ඇස්තමේන්තුගත අගය හා සසඳා බැලීමේ දී මෙමගින් රු.258,129,549/- ක අඩුවීමක් පිළිබිඹු වේ.

2012 සහ 2013 වර්ෂ තුළ දී ඔට්ටු හා සූදු බදු රැස්කිරීම එහි ඇස්තමේන්තු ගත අගය හා සසඳා බැලීමක් 18 වගුවේ දැක්වේ.

**වගුව 18 :- ඔට්ටු හා සූදු බදු රැස් කිරීම්**

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම රැස් කිරීම (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2013 | 850,000,000.00 | 591,870,451.00 | 70% |
| 2012 | 312,000,000.00 | 289,175,098.00 | 93% |



## 2.16 ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම.

2013 වසර තුළ ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු ආදායම් රැස්කිරීම රු. 750,907,497/- ක් වූ අතර, මෙම ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු ගෙවීම සඳහා ලියාපදිංචි මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව 253 ක් විය.

19 වන වගුව ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්දෙහි ආදායම් ඇස්තමේන්තුව 2012 සහ 2013 වසරවල රැස්කරන ලද ආදායම සමඟ සංසන්දනය කරයි.

## 2.17 මුද්දර බදු රැස්කිරීම

**වගුව 19 :- ඇස්තමේන්තු සමඟ ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම**

| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම් රැස් කිරීම (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2013 | 1,250,000,000.00 | 750,907,497.00 | 60% |
| 2012 | 950,000,000.00 | 709,648,933.00 | 75% |

මුද්දර බදු ලෙස රුපියල් මිලියන 6,884 ක් වර්ෂය තුළ දී උත්පාදනය විය. 2011 අංක 13 දරන පළාත් සභා පනත (මුද්දර බදු මාරු කිරීම) ප්‍රකාරව මුද්දර බදු රැස්කිරීම් සම්පූර්ණ ප්‍රමාණය පළාත් සභාවලට මාරුකරන ලදි. මුද්දර බදු පදනම ඉහළ නැංවීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් උපදේශන හා අධීක්ෂණ හමු පවත්වන ලද අතර, ඒ අනුව 2013 වසර තුළ ස්ථාන 191 ක් නිරීක්ෂණයට බඳුන් විය. සමථායන නියෝජිතයන් 7,623 ක් (2013.09.30 දිනට) මුද්දර බදු සඳහා විධිමත්ව ලියාපදිංචි වී තිබූ අතර, ඒ අතරින් 7,591 දෙනෙකු උපලේඛන ඉදිරිපත් කොට තිබුණේ 100% අනුකූලතාවයක් වාර්තා කරමිනි.

## 2.18 ඉඩම් පැවරීම මත බදු

2013 බදු යෝජනා යටතේ ක්‍රියාත්මක කරන ලද ඉඩම් බද්දෙන් වසර සඳහා රැස්කිරීම රුපියල් මිලියන 96,741 ක් වූ අතර, එය ඇස්තමේන්තුගත ඉලක්කයට වඩා රු.මිලියන 14.74 කින් වැඩි වීමකි.

2013 අයවැය යෝජනා මගින්, විදේශිකයන්ට දේපළ පැවරීම මත 100% වූ බද්ද සංශෝධනය කිරීම සහ ඇතැම් ව්‍යතිරේකයන්ට යටත්ව විදේශිකයන්ට දේපළ සම්පූර්ණයෙන්ම පැවරීම තහනම් කිරීම රජය විසින් ප්‍රකාශයට පත්කර ඇත.


විදේශීය ජාතිකයනට සහ සමාගම්වලට දේපළ පැවරීම ආශ්‍රිත වටිනාකම මත 15% බද්දකට යටත්ව කල්බදු ආකාරයෙන් අවසර දී ඇත.

## 2.19 දේශීය ආදායම් රැස් කිරීම - වසර 2009 සිට 2013 දක්වා

2009 සිට 2013 වසර දක්වා දෙපාර්තමේන්තුවේ ආදායම් රැස් කිරීම් බදු වර්ග අනුව 20 වන වගුවෙන් දැක්වෙන දත්ත මගින් නිරූපණය කර ඇත.

## වගුව 20 :- 2009 සිට 2013 දක්වා දේශීය ආදායම් රැස් කිරීම් - බදු වර්ග අනුව විශ්ලේෂණය

| බදු වර්ගය | 2009 | | 2010 | | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % |
| ආදායම් බද්ද | 125,350 | 35.51 | 117,575 | 27.83 | 135,974 | 30.64 | 157,729 | 35.57 | 199,070 | 40.42 |
| ආර්ථික සේවා ගාස්තු | 14,207 | 4.02 | 18,048 | 4.27 | 21,335 | 4.81 | 14,864 | 3.35 | 6,596 | 1.34 |
| එකතු කළ අගය මත බදු | 171,118 | 48.47 | 219,563 | 51.97 | 215,420 | 48.54 | 204,656 | 46.15 | 217,687 | 44.2 |
| හර බදු | 8,036 | 2.28 | 10,843 | 2.57 | 4,232 | 0.95 | - | 0.00 | | 0.00 |
| ඔට්ටු හා සූදු බදු | 269 | 0.08 | 295 | 0.07 | 286 | 0.06 | 289 | 0.07 | 592 | 0.12 |
| කොටස් ගණුදෙනු බද්ද | 560 | 0.16 | 2273 | 0.54 | 3,264 | 0.74 | 1,285 | 0.29 | 1,197 | 0.24 |
| පිරිවැටුම් බද්ද | 337 | 0.10 | 388 | 0.09 | 131 | 0.03 | 138 | 0.03 | 218 | 0.04 |
| මුද්දර බද්ද | 3,327 | 0.94 | 4,440 | 1.05 | 7,217 | 1.63 | 6,535 | 1.47 | 6,884 | 1.4 |
| භාණ්ඩ හා සේවා බද්ද | 56 | 0.02 | 39 | 0.01 | 25 | 0.01 | 12 | 0.00 | 16 | 0.00 |
| ජාතික ආරක්ෂක බද්ද | 17 | 0.00 | 23 | 0.01 | 15 | 0.00 | 4 | 0.00 | 2 | 0.00 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 571 | 0.16 | 830 | 0.20 | 1,106 | 0.25 | 710 | 0.16 | 751 | 0.15 |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද | 27,205 | 7.71 | 46,022 | 10.89 | 53,501 | 12.05 | 57,106 | 12.88 | 59,397 | 12.06 |
| ඉඩම් බද්ද | - | - | - | - | - | - | - | - | 97 | 0.02 |
| සමාජ වගකීම් බද්ද | 1,962 | 0.56 | 2,173 | 0.51 | 1,324 | 0.30 | 127 | 0.03 | **32** | 0.01 |
| **රැස්කිරීම් වල එකතුව** | **353,015** | **100.00** | **422,512** | **100.00** | **443,830** | **100.00** | **443,455** | **100.00** | **492,539** | **100.00** |




**සටහන 10**
**2009 සිට 2013 දක්වා දේශීය ආදායම් රැස්කිරීම් බදු අනුව විශ්ලේෂණය**

## පරිච්ඡේදය 3 - වියදම් සහ ඵලදායිතා අනුපාතය


වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙහි මුළු වියදම රුපියල් මිලියන 1,876 ක් වූ අතර, පසුගිය වසරේ අගය වූ රුපියල් මිලියන 1,604 සමඟ සසඳා බැලීමේදී එය 16.93% ක ඉහළ යාමක් වාර්තා කරයි. මුළු වියදමෙන් 89.73% ක් නැතහොත් රු. මිලියන 1,683 ක් පුනරාවර්තන වියදම් සඳහා වැය කරන ලදි. 2012 වසරේ දී අනුරූපී අගය රු. මිලියන 1,562 ක් විය. වේතන සඳහා වූ වියදම 2012 වසරේ පැවති රුපියල් මිලියන 1,209 සාපේක්ෂව 5.21% ක ඉහළ යාමකි. මුළු වියදමෙන් 67.85% ක් සහ පුනරාවර්තන වියදම්වලින් 75.61% කින් සමන්විත වූ මෙම අගය විශාලතම තනි වියදම් අයිතමය විය.

2012 වර්ෂය හා සසඳා බලන කළ වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 357.95% ක වැඩිවීමක් වාර්තා කරන ලද අතර, එය රුපියල් මිලියන 193 ට ළඟා වී ඇත. මෙම අගය 2012 වසරේ දී රුපියල් මිලියන 42 ක් විය. දෙපාර්තමේන්තුවේ මුළු වියදමෙන් 10.27% ක් ප්‍රාග්ධන වියදම් නියෝජනය කරයි. (2012 වසරේ දී එය 2.62% ක් විය.)


### 3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම 2011, 2012 සහ 2013 වර්ෂ සමඟ සැසඳීම

වගුව 21 - මුළු වියදම - 2011, 2012 සහ 2013

| විස්තරය | 2011 (රු.'000) | % | 2012 (රු.'000) | % | 2013 (රු.'000) | % |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පඩි නඩි | 1,110,669 | 71.17% | 1,209,700 | 75.40% | 1,272,722 | 68.50% |
| ගමන් වියදම් | 15,844 | 1.01% | 24,231 | 1.51% | 19,124 | 1.03% |
| සැපයුම් | 58,217 | 3.73% | 61,851 | 3.86% | 67,269 | 3.59% |
| නඩත්තු | 24,457 | 1.56% | 33,851 | 2.11% | 30,999 | 1.67% |
| කොන්ත්‍රාත් සේවා | 209,962 | 13.45% | 210,813 | 13.41% | 265,284 | 14.28% |
| පැවරුම් | 15,427 | 0.98% | 21,761 | 1.36% | 27,871 | 1.50% |
| වෙනත් | - | | 60 | 0.00% | | |
| **උප එකතුව** | **1,434,576** | **91.94%** | **1,562,267** | **97.38%** | **1,683,269** | **90.57%** |
| ප්‍රාග්ධන වියදම් | | | | | | |
| ප්‍රතිසංස්කරණ සහ වැඩි දියුණු කිරීම | 108,142 | 6.93% | 19,893 | 1.24% | 113,414 | 7.01% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 7,717 | 0.49% | 13,875 | 0.86% | 40,243 | 2.15% |
| ධාරිතා ගොඩනැගීම | 9,987 | 0.64% | 8,293 | 0.52% | 20,963 | 1.12% |
| **උප එකතුව** | **125,846** | **8.06%** | **42,061** | **2.62%** | **192,620** | **10.27%** |
| මුළු එකතුව | **1,560,422** | **100%** | **1,604,328** | **100%** | **1,875,889** | **100%** |



## 3.2 2013 පුනරාවර්තන වියදම් විශ්ලේෂණය




## 3.3 ඵලදායී අනුපාතය

2013 වසරේ දී දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් 1,875,888,898/- වූ අතර, රැස් කළ ආදායම රුපියල් 492,539,431,267/- ක් විය. ඵලදායී අනුපාතය (එනම්, වියදම් කළ සෑම රුපියලක් සඳහාම රැස් කළ ආදායම) 262:1 ක් ලෙස ගණනය කෙරේ. එනම් රුපියල් 100 ක් රැස් කිරීමේ පිරිවැය ශත 38 කි. රු.100 ක් රැස්කිරීමේ පිරිවැය ආනයන මත එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩ නැගීමේ බදු රහිතව ගත් කළ ශත 50 කි. (පෙර වර්ෂයේ දී මෙම අගයන් පිළිවෙලින් ශත 36 සහ ශත 50 ක් විය.)

**වගුව 22 - ආදායම් රැස් කිරීම, මුළු වියදම හා එකතු කිරීමේ පිරිවැය (රු.මිලියන)**

| විස්තරය | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| **ආදායම් රැස් කිරීම** | | | |
| ආදායම් බද්ද | 135,973.51 | 157,728.90 | 199,070.03 |
| ආර්ථික සේවා ගාස්තු | 21,335.09 | 14,864.24 | 6,595.60 |
| එකතු කළ අගය මත බද්ද | 215,419.83 | 204,656.03 | 217,686.92 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 53,501.01 | 57,105.79 | 59,397.33 |
| හර බද්ද | 4,232.33 | -0.48 | (0.08) |
| ඔට්ටු හා සූදු බද්ද | 286.88 | 289.18 | 591.87 |
| කොටස් ගණුදෙනු බද්ද | 3,263.52 | 1,285.74 | 1,197.41 |
| පිරිවැටුම් බද්ද | 130.62 | 138.26 | 218.08 |
| මුද්දර ගාස්තු | 7,217.34 | 6,535.31 | 6,884.39 |
| භාණ්ඩ හා සේවා ගාස්තු | 25.54 | 11.99 | 15.97 |
| ජාතික ආරක්ෂක බද්ද | 14.74 | 3.93 | 2.15 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 1106.04 | 709.65 | 750.91 |
| ඉඩම් බද්ද | | | 96.74 |
| සමාජ වගකීම් බද්ද | 1,323.56 | 127.22 | 32.11 |
| **මුළු එකතුව** | **443,830.01** | **443,455.76** | **492,539.43** |

| | | | |
|---|---|---|---|
| **වියදම්** | | | |
| **<u>පුනරාවර්ථන වියදම්</u>** | | | |
| පඩිනඩි | 1,110.67 | 1,209.70 | 1,272.72 |
| ගමන් වියදම් | 15.84 | 24.23 | 19.12 |
| සැපයුම් හා උපකරණ | 58.22 | 61.85 | 66.72 |
| නඩත්තු හා අළුත්වැඩියා | 24.46 | 33.85 | 31.00 |
| සේවා | 209.96 | 210.81 | 265.28 |
| මාරු කිරීම් | 15.43 | 21.76 | 27.87 |
| වෙනත් | - | 0.06 | |
| **<u>ප්‍රාග්ධන වියදම්</u>** | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම | 108.14 | 19.89 | 131.41 |
| අත්පත් කර ගැනීම් | 7.72 | 13.88 | 40.24 |
| ධාරිතා ගොඩනැගිලි | 9.98 | 8.29 | 20.96 |
| **මුළු වියදම** | **1,560.42** | **1,604.32** | **1,875.89** |
| | | | |
| **රු.100 බැගින් එකතු කිරීමේ පිරිවැය** | **0.35** | **0.36** | **0.38** |
| **ආනයන මත එකතු කළ අගය මත බදු හා ජා.ගො.බදු හැර රු.100 බැගින් එකතු කිරීමේ පිරිවැය** | **0.5** | **0.5** | **0.5** |

## 3.4 අභ්‍යන්තර විගණන

අභ්‍යන්තර විගණන ශාඛාව මගින් සිදු කරන ලද විගණනවලට සියලුම වියදම්, එනම්, දෛනික වාහන ධාවන සටහන් (ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වාගෙන යනු ලබන) පඩි ලැයිස්තු, වාර්ෂික පරීක්ෂණ මණ්ඩල වාර්තා බැංකු සැසඳුම් ප්‍රකාශන (මහජන බැංකුව, ලංකා බැංකුව, මහ බැංකුව) පරීක්ෂා කිරීම ඇතුළත් විය. තවද, මෙයට අතිරේක වශයෙන් අගරු චෙක්පත්වල මුදල් අය කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග, එකතු කළ අගය මත බදු සහ ආදායම් බදු වලින් සිදුකළ ආපසු ගෙවීම්, අග්‍රිම ගිණුම් සහ අග්‍රිම මුදල් ගිණුම් පරීක්ෂා කිරීම අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

## පරිච්ඡේදය 4 - පැහැර හරින ලද බදු

### 4.1 පැහැර හරින ලද බදු

23 වන වගුවෙන් 2013.12.31 දිනට පැහැර හරින ලද බදු ප්‍රමාණයන්, අත්හිටවූ බදු ප්‍රමාණයන්, දණ්ඩන සහ රැස් කරගත හැකි පැහැර හැර ඇති බදු ප්‍රමාණයන් නිරූපණය කරයි.

**වගුව 23 - පැහැර හරින ලද බදු විශ්ලේෂණය - 2013.12.31 දිනට**

| බදු වර්ගය | පැහැර හරින ලද දළ බද්ද (රු.) | දඩ මුදල (රු.) | දණ්ඩන හැර මතභේදයට තුඩු දුන් බදු (රු.) | මතභේදයට තුඩු දුන් බදුවලට අදාළ දණ්ඩන (රු.) | රැස් කළ හැකි බදු (රු.) | රැස් කළ හැකි දණ්ඩන (රු.) |
|---|---|---|---|---|---|---|
| ආදායම් බද්ද | 40,589,933,958 | 29,351,269,412 | 36,875,815,971 | 27,159,402,087 | 3,714,117,987 | 2,191,867,325 |
| ආදායම් බද්ද මත අධිභාරය | 667,380,976 | 511,022,570 | 663,803,828 | 509,232,244 | 3,577,148 | 1,790,326 |
| ආදායම් බද්ද (පොළිය මත රඳවා ගැ. බදු) | 1,448,532,023 | 633,876,377 | 1,358,583,354 | 593,652,671 | 89,948,669 | 40,223,706 |
| එ.අ.බ. | 49,653,075,695 | 26,746,339,378 | 44,591,886,331 | 24,026,545,870 | 5,061,189,364 | 2,719,793,508 |
| එ.අ.බ. (මූල්‍ය සේවා) | 8,631,036,788 | 5,397,715,997 | 8,623,477,216 | 5,397,259,173 | 7,559,572 | 456,824 |
| ආ.සේ. ගා. | 4,844,148,037 | 2,770,569,835 | 3,370,431,050 | 2,057,012,141 | 1,473,716,987 | 713,557,694 |
| ජා.ගො.බ. | 2,653,570,063 | 1,383,855,770 | 1,611,407,258 | 951,089,645 | 1,042,162,805 | 432,766,125 |
| මුද්දර බද්ද | 46,831,124 | 14,902,822 | - | - | 46,831,124 | 14,902,822 |
| හර බද්ද | 2,215,581,368 | - | 2,215,581,368 | - | - | - |
| පිරිවැටුම් බද්ද | 3,708,257,287 | 1,805,763,704 | 3,708,257,287 | 1,805,763,704 | - | - |
| භාණ්ඩ හා සේවා බද්ද | 1,007,014,395 | 1,098,684,757 | 1,007,014,395 | 1,098,684,757 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 2,058,858,025 | 854,707,764 | 2,058,858,025 | 854,707,764 | - | - |
| **ජාතිය ගොඩනැගීමේ දායක මුදල** | 29,598,611 | 8,045,839 | 29,598,611 | 8,045,839 | - | - |
| ධන බද්ද | 919,732 | 504,648 | 919,732 | 504,648 | - | - |
| ත්‍යාග බද්ද | 2,409 | 1,204 | 2,409 | 1,204 | - | - |
| සමාජ වගකීම් බද්ද | 2,276,342 | 188,856 | 1,940,879 | 147,605 | 335,463 | 41,251 |
| සමථයකට පත්වන දණ්ඩන | - | 288,781,090 | - | 120,344,735 | - | 168,436,355 |
| **එකතුව** | 117,557,016,833 | 70,866,230,023 | 106,117,577,714 | 64,582,394,087 | 11,439,439,119 | 6,283,835,936 |

සටහන:

i. අදාළ එක් එක් බදු වර්ගය යටතේ පවත්නා වූ සමුච්චිත ශේෂ ප්‍රමාණය මුළු හිඟබදු ප්‍රමාණය මගින් නියෝජනය කෙරේ. කෙසේ වෙතත්, ඉහත වර්ගීකරණය කර ඇති පරිදි නොගෙවූ බදු ඒ ස්වරූපයෙන්ම සම්පූර්ණයෙන් ම හිඟව නොපවතී.

ii. කවර වූ හේතුවක් මත තක්සේරුවක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී (බදු ගෙවන්නා විසින් වාර්තා ඉදිරිපත් නොකිරීම, වාර්තාව පදනම් කොට ගෙන බදු නොගෙවීම, සාවද්‍ය වාර්තා හෝ ප්‍රකාශන ඉදිරිපත් කිරීම) නොගෙවූ හෝ හිඟ මුදලක් ඇති වේ. නියමිත දිනට බදු නොගෙවීම වෙනුවෙන් දණ්ඩන මුදල සාමාන්‍යයෙන් 10% ක් වන අතර, ආදායම් බදු සම්බන්ධයෙන් එය 50% ක බදු ප්‍රමාණයක් කරා ළඟා වනතුරු නොගෙවන ලද සෑම මාසයක් සඳහා ම 2% ක ප්‍රමාණයක් සහ එ.අ.බ. සම්බන්ධයෙන් 100% ක ප්‍රමාණයක් වේ.

iii. තක්සේරු කිරීම්වලට එරෙහිව බදු ගෙවන්නන් විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී සහ ඉන් අනතුරුව ඔවුන් විසින් තම අභියාචනා අයිතිවාසිකම් සඳහා ඉල්ලුම්කර ඇති පරිදි නිරාකරණය කිරීම සිදු කරනු ලබන විට ඇතැම් නඩු අවස්ථා සම්බන්ධයෙන් ඉහළ අභියාචනා මට්ටම් දක්වා (අභියාචනා කොමිසම, අභියාචනාධිකරණය ආදිය) යොමු කරනු ලැබිය හැකි ය. මෙම බදු ප්‍රමාණයන් මතභේදයට තුඩු දුන් බදු, දණ්ඩන හෝ අත්හිට වූ බදු ලෙස වර්ගීකරණය කළ හැකිය. අභියාචනා විසඳීමේ දී එකතු කරන ලද දණ්ඩන සමඟ තක්සේරු කළ යම් අතිරේක ප්‍රමාණය විසර්ජනය කළ යුතු වේ.

## 4.2 හිඟබදු අඩුකිරීම සඳහා සැලසුම.

(අ) හිඟබදු අයකර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ පියවර පිළිබඳ අදාළ ප්‍රඥප්තීන්වල සඳහන් වේ. තක්සේරු නිකුත් කිරීමෙන් එවැනි පියවර අඛණ්ඩව ගනු ලැබුව ද, සැලකිය යුතු බදු ප්‍රමාණයක් හිඟව පවත්නා බව ද දැක ගත හැකි ය.

(ආ) 2010 අංක 16 දරන හිඟ බදු අය කරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි හිඟ බදු අය කරගැනීමේ ඒකකය විසින් අදාළ හිඟ බදු වාර්තා පිළියෙල කර ඇති අතර අතිරේක අධිකාරිත්වයක් සහිත ඵලදායී ලෙස බදු ආපසු අය කරගැනීමේ කටයුතු තුළින් වඩාත් යහපත් ප්‍රතිඵල අපේක්ෂා කෙරේ. (යම් යම් අවස්ථාවන්හි දී හිඟබදු අයකර ගැනීම සඳහා මෙන්ම ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික කාරණා සම්බන්ධයෙන් විධිමත් සහ වේගවත් ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා වන පනතකි.)

## 4.3 හිඟබදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම

2010 අංක 16 දරන හිඟබදු (විශේෂ විධිවිධාන) පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාරව, 2010 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් ලිත් වර්ෂයක අවසානය වනවිට මේ පනතේ උප ලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් නීතියක් යටතේ පැහැර හැර ඇති එහෙත් ඊට උපචිත වූ මුදලක් හෝ අත්හිට වූ හෝ විලම්භනය කරන ලද බදු මුදලක කොටස හැර, බදුවල මුළු එකතුව ඊට පෙරාතුව වූ වර්ෂයේ මුළු බදුවල එකතුවට වැඩි වන්නේ යම් ප්‍රමාණයකින් ද, එම බදු මුදල් ප්‍රමාණය එකී පෙරාතුවම වූ වර්ෂයේ එම නීතිය යටතේ පනවනු ලැබූ සහ නියම කරනු ලැබූ බදුවලින් සියයට තුනක් නො ඉක්මවන බවට වග බලාගැනීම කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.
ඒ අනුව,

| | | |
|---|---|---|
| 2013.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | - | රු. 11,439,439,119.00 |
| අඩුකලා | | |
| 2012.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | | රු. 10,248,070,817.00 |
| 2013 වර්ෂයේ හිඟ බදු අඩුවීම | | රු. 1,191,368,302.00 |
| 2013.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු බදු රැස්කිරීම් | - | රු.418,423,600,997.00 |
| 2012 වර්ෂයේ මුළු බදු රැස්කිරීම් වලින් 3% | - | රු.12,527,080,299.00 |

එබැවින් 2013 වසරේ දී හිඟ බදුවල ශුද්ධ එකතුවීමක් දක්නට නොමැත. ඒ අනුව 2010 අංක 16 දරන හිඟ බදු (විශේෂ විධිවිධාන) පනතින් අපේක්ෂිත ආකාරයට එම අගය පෙර වර්ෂයේ මුළු බදු රැස්කිරීමෙන් 3% කට වඩා අඩු අගයක් ගනී.

## පරිච්ඡේදය 5 - විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අය කර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා

### 5.1 විගණන

ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ඒකකයෙහි ස්වභාවය හා විශාලත්වයට අනුකූලව, සමස්ථ බදු ගෙවන්නන් සංඛ්‍යාවම හැකි පමණ පුළුල් ලෙසින් ආවරණය කිරීමේ අරමුණින් යුතුව විගණන සහ විමර්ශන සිදුකරනු ලැබේ. අනෙකුත් ක්ෂේත්‍රයනට වඩා විමර්ශනමය උපක්‍රම භාවිත කිරීමෙන් වඩාත් ඵලදායී ප්‍රතිඵල ලැබී ඇත්තේ විශාල බදු ගෙවන්නන් මගින් බව හඳුනාගෙන ඇත. ඒ අනුව විගණන කාර්යයන් වඩාත් සතුටුදායක අයුරින් සිදු කළ අතර, එමගින් අතිරේක බදු ප්‍රමාණයක් රැස් කරගැනීමට හැකි විය. එලෙස රැස් කරගන්නා ලද අතිරේක බදු ප්‍රමාණය 24 වන වගුවෙහි දක්වා ඇත.

**වගුව 24 :- වර්ෂය තුළ සිදු කරන ලද විගණන සහ අතිරේක බදු රැස්කිරීම පිළිබඳ විස්තර (රු.,000)**

| | ආදායම් බද්ද | එ.අ.බ. | ආ.සේ.ගා. | උ.වි.ගෙ. | ජා.ගො.බ. | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය තුළ තක්සේරු කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 7,646,917 | 5,701,667 | 467,464 | 229,155 | 2,461,476 | 3,163,295 | 19,669,974 |
| වර්ෂය තුළ රැස්කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 6,424,751 | 5,020,038 | 390,183 | 220,000 | 1,150,315 | 2,356,973 | 15,562,260 |
| **2013 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද විගණන සංඛ්‍යාව** | **5,248** | | | | | | |
| **2013 වර්ෂය තුළ දී අවසන් කරන ලද විගණන සංඛ්‍යාව** | **5,206** | | | | | | |

**වගුව 25 - සංස්ථාපිත සහ අනෙකුත් අංශ වලින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය (දණ්ඩන ඇතුළුව)**

| විස්තරය | තක්සේරු කරන ලද හා එකඟ වූ අතිරේක ආදායම/ පිරිවැටුම (රු.) | තක්සේරු කරන ලද සහ එකඟ වූ අතිරේක බදු (රු.) | | | | රැස් කරන ලද අතිරේක බදු (රු.) (හිලව් කළ ආපසු ගෙවීම් ඉල්ලීම් ඇතුළුව) |
|---|---|---|---|---|---|---|
| | | සංස්ථාපිත විශාල බදු ගෙවන්නන් | සංස්ථාපිත අනෙකුත් | අනෙකුත් ඒකක | එකතුව | |
| ආදායම් බද්ද | 51,374,741 | 5,008,968 | 1,482,610 | 1,155,339 | 7,646,917 | 6,424,751 |
| එකතු කළ අගය මත බද්ද | 35,802,181 | 2,107,211 | 1,652,195 | 1,942,260 | 5,701,667 | 5,020,038 |
| ආර්ථික සේවා ගාස්තු | 80,313,986 | 174,587 | 181,454 | 111,423 | 467,464 | 390,183 |
| උපයන විට ගෙවීම් | 494,793 | 163,000 | 66,155 | - | 229,155 | 220,000 |
| ජා.ගො.බ. | 69,935,407 | 1,722,750 | 436,177 | 302,549 | 2,461,476 | 1,150,315 |
| අනෙකුත් | 16,733,569 | 3,116,768 | 37,805 | 8,722 | 3,163,295 | 2,356,973 |
| එකතුව | **254,654,677** | **12,293,285** | **3,856,396** | **3,520,293** | **19,669,974** | **15,562,258** |

### 5.2 අභියාචනා

තක්සේරුවලට එරෙහිව ලැබූ අභියාචනා 1,480 ක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ දී විසඳා අවසන් කරන ලද අතර, අභියාචනා විශ්ලේෂණය කිරීමේ තත්ත්වය පහත සඳහන් පරිදි වේ.

| වගුව 26 - ලැබූ සහ නිරාකරණය කරන ලද අභියාචනා සම්බන්ධ විශ්ලේෂණය | | ආදායම් බද්ද | එකතු කළ අගය මත බද්ද | ආර්ථික සේවා ගාස්තු | ජාතිය ගොඩ නැගීමේ බදු | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2013.01.01 දිනට ශේෂය | අංශ ( APL 2 පරිදි) | 147 | 367 | 28 | 39 | 2 | **583** |
| | අභියාචනා අංශය (APL 2 පරිදි) | 41 | 168 | - | 5 | - | **214** |
| | දේ.ආ.කො.ජ.විසින් අභියාචනා විමර්ශනයට භාජනය කිරීම | 131 | 355 | 28 | - | 1 | **515** |
| වර්ෂය තුළ දී ලියාපදිංචිය ( APL 2 පරිදි) | | **411** | **933** | **70** | **60** | **2** | **1476** |
| අවසන් කළ | නිර්ණය කරන ලද (දේ.ආ.කො.ජ.) | 130 | 291 | 27 | 9 | 1 | **458** |
| | අංශ (APL 4 පරිදි) | 311 | 333 | 58 | 42 | - | **744** |
| | අභියාචනා අංශය | 56 | 204 | 8 | 10 | - | **278** |
| දේ.ආ.කො.ජ.ට විභාගය සඳහා ඉදිරිපත් කළා | | 69 | 336 | 12 | 14 | 2 | **433** |
| 2013.12.31 දිනට ශේෂය | ඒකක (APL 2 පරිදි) | 114 | 135 | - | 15 | 2 | **266** |
| | *අභියාචනා අංශය (APL 2 පරිදි) | 49 | 460 | 20 | 23 | - | **552** |
| | දේ.ආ.කො.ජ.විසින් අභියාචනා විමර්ශනයට භාජනය කිරීම | 70 | 400 | 13 | 5 | 2 | **490** |
| *වර්ෂය තුළ දී අභියාචනා අංශයට ලැබුන ලිපිගොනු | | **79** | **247** | **0** | **35** | **2** | **363** |

## 5.3 එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණන

දෙපාර්තමේන්තුවේ විශේෂ එකතු කළ අගය මත බදු විශේෂ විගණන ඒකකය මගින් එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණනයන් ලෙස බදු අය කළ හැකි කාලපරිච්ඡේද 5,424 ක් ආවරණය වන පරිදි, වර්ෂය තුළ දී සිද්ධීන් (ලිපිගොනු) 226 ක් සම්පූර්ණ කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් අතිරේක බදු ලෙස රු. 439,034,814/- ක මුදලක් රැස් කරගත හැකි විය.

## 5.4 අය ක්‍රියාමාර්ග

වර්ෂය තුළ බදු අය කිරීම් සඳහා කටයුතු කළ ලිපිගොනු සංඛ්‍යාව හා නිවේදන සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත වගුවෙහි දැක්වේ.

| වගුව 27 - අය ක්‍රියා මාර්ග | සිද්ධීන් (ලිපිගොනු) ගණන | දැන්වීම් |
|---|---|---|
| තහනම් නියෝග නිකුත් කිරීම | 1481 | 2019 |
| නඩු පැවරීම් | 676 | 577 |
| වෙනත් ක්‍රියා මාර්ග | 5853 | 4324 |

## 5.5 ආපසු ගෙවීම්

වර්ෂය තුළ දී සිදු කරන ලද ආපසු ගෙවීම් පිළිබඳ විශ්ලේෂණය (හිඟ බදු සඳහා හිලව් කළ ආපසු ගෙවීම් හැර) පහත දැක්වේ.

| වගුව 28 - ආපසු ගෙවීම් විශ්ලේෂණය | | | | |
|---|---|---|---|---|
| බදු වර්ගය | 2011 | | 2012 | |
| | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % |
| එකතු කළ අගය මත බදු | 3,149,577,623 | 1.54% | 459,692,181 | 0.21% |
| සංස්ථාපිත ආදායම් බදු | 194,026,255 | 0.25% | 167,326,086 | 0.20% |
| වෙනත් සංස්ථාපිත නොවන ආදායම් බදු | 55,356,159 | 0.88% | 50,932,924 | 0.59% |
| නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීමේ බදු | 5,598,717 | 1.63% | 2,154,419 | 0.84% |
| පොළී මත රඳවා ගැනීමේ බදු | 12,606,388 | 0.02% | 4,326,494 | 0.01% |
| උපයන විට ගෙවීමේ බදු | 15,808,330 | 0.11% | 375,690,454 | 2.02% |
| හර බද්ද | 2,430,112 | - | 213,182 | - |
| එකතුව | **3,435,403,584** | **0.81%** | **1,060,335,740** | **0.23%** |

එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් ඉල්ලීම් 2,270 ක් වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අතර, රුපියල් මිලියන 459.69 ක් ආපසු ගෙවමින් සිද්ධීන් 732 ක් වර්ෂය තුළ දී අවසන් කරන ලදි. වර්ෂය තුළ දී ආපසු ගෙවන ලද මුළු මුදලෙන් රුපියල් මිලියන 27.36 ක මුදලක් සමස්ථ හිඟ බදුවලට එරෙහිව මාරුකිරීම හෝ හිලව් කිරීම කරන ලදි.

සරල කරන ලද එ.අ.බ. යෝජනා ක්‍රමය (SVAT), ණය වවුචර් නිකුත් කිරීමේ පද්ධතිය මගින් ආනයන සහ විශේෂ ව්‍යාපෘතීන්වල යෙදී සිටින එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී සිටින පුද්ගලයන්ගෙන් ලද එ.අ.බ. ආපසු ඉල්ලීම් සංඛ්‍යාව අවම කරයි. 2011 වසරේ සරල කරන ලද එ.අ.බ. හඳුන්වාදීමත් සමඟ, ආපසු ගෙවන ලද මුදල අඩු වී ඇත. එය 2011 වසරේ දී රු. 6,348,377,132 ක් ද, 2012 වසරේ දී රු. 3,149,577,623 ක් ද, 2013 වසරේ දී රු.459,692,181 ක් ද විය. කොමසාරිස් ජනරාල් විසින් සුපරීක්ෂණය කරනු ලබන මෙම ස.එ.අ. බදු ක්‍රමය යටතේ, සුදුසුකම් ලබන පුද්ගලයින් සඳහා සපයනු ලබන භාණ්ඩ හා සේවා ඔවුන්ගේ බද්දට යටත් ආදායමින් 50% ක් වන විට පුද්ගලයින් වැඩි සංඛ්‍යාවක් භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට සුදුසුකම් ලබයි. එබැවින්, එ.අ.බ. රැස්කිරීමක් සිදු කළ නොහැකි අතර, මීට පෙර ගෙවන ලද එ.අ.බ. යෙදවුම් බදු ලෙස ඉල්ලීමක් කරන ලදි.

වසර තුළ දී පුද්ගලයින් 473 දෙනෙකු ස.එ.අ. බදු ක්‍රමය සඳහා ලියාපදිංචි වී ඇත.

| වගුව 29 - සරල කරන ලද එ.අ.බ. බැර වවුචර් විශ්ලේෂණය | | | |
|---|---|---|---|
| වසර | ආපසු ගෙවන ලද එ.අ.බ. ප්‍රමාණය (රු.) | වසර තුළ ශුද්ධ ආදායම් රැස්කිරීම % | නිකුත් කරන ලද සරල කරන ලද එ.අ.බ. බැර වවුචර්වල එ.අ.බ. කොටසෙහි වටිනාකම |
| 2010 | 8,869,784,827 | 4.05% | - |
| 2011 | 6,348,377,132 | 2.94% | 26,100,132,430 (2011 අප්‍රේල් සිට) |
| 2012 | 3,149,577,623 | 1.54% | 41,991,314,893 |
| 2013 | 459,692,181 | 0.21% | 45,337,507,743 |

## පරිච්ඡේදය 6 - ජාත්‍යන්තර සබඳතා

### 6.1 ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්

ජාත්‍යන්තර වෙළෙඳාමේ දි හෝ ගණුදෙනු වලදී සිදුවන නෛතික ද්විත්ව බදුකරණය සහ ආදායම් පැහැර හැරීම, ඉවත් කිරීම හෝ අඩු කිරීම පිණිස රටවල් විසින් ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්වලට එළැඹේ. විදේශ ආයෝජන ඇදගැනීමෙහිලා ණය යාන්ත්‍රණය, විශේෂඥ දැනුම, නවීන තාක්ෂණය සහ රැකියා අවස්ථා යනාදිය ලබා ගැනීම සඳහා මග පෙන්වීම වැනි විවිධාකාරයෙන් මෙම ගිවිසුම් සුවිශේෂී කාර්යයන් ඉටු කරන බැවින් ඒවා සංවර්ධනය වෙමින් පවත්නා වූ රටවලට වඩාත් සුවිශේෂී වේ.

මෙයට අතිරේක වශයෙන් ශ්‍රී ලංකාවේ ඇතැම් ගිවිසුම් පාර්ශ්වකරුවන් සමඟ දැනටමත් ඇති කරගෙන තිබෙන පරිදි, ගිවිසුමකට එළඹෙන රටවල් දෙක අතර සමගිය සහ සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා ද ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට එළඹෙනු ලැබේ.

පහත 30 වැනි වගුවෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාව 2013.12.31 දින වන විට රටවල් 38 ක් සමග ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට සහ බහු පාර්ශ්වීය ගිවිසුම්වලට එළැඹ තිබේ. වෙනත් ගිවිසුම් හයක (6) ආකෘතීන් වසර තුළ දී අවසන් කරන ලද අතර, එය අත්සන් කිරීමට නියමිත තිබිණි.

#### 6.1.1 ද්විත්ව බදු ගිවිසුම් සහ බහුපාර්ශ්වීය ගිවිසුම් පිළිබඳ තොරතුරු

**වගුව 30 - 2013.12.31 දිනට ද්විත්ව බදු ගිවිසුම් බලපවත්නා රටවල්**

| | රට | ගිවිසුම් අත්සන් කළ දිනය | ගැසට් පත්‍රය | | ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වීම (තක්සේරු වර්ෂය අනුව) |
|---|---|---|---|---|---|
| | | | අංකය | දිනය | |
| 1 | ඕස්ට්‍රේලියාව | 18-දෙසැ-1989 | 657/2 | 08-අප්‍රේල්-1991 | 1992/93 |
| 2 | බංගලාදේශය | 24-ජූලි-1986 | 448/13 | 07-අප්‍රේල්-1987 | 1989/90 |
| 3 | බෙල්ජියම | 03-පෙබ-1983 | 292/6 | 09-අප්‍රේල්-1984 | 1984/85 |
| 4 | කැනඩාව | 23-ජූනි-1982 | 253/8 | 13-ජූලි-1983 | 1986/87 |
| 5 | චීනය | 11-අගෝ-2003 | 1374/20 | 06-ජන-2005 | 2006/07 |
| 6 | ඩෙන්මාර්කය (සංශෝධිත) | 22-දෙසැ-1981 | 228/15 | 20-ජන-1983 | 1980/81 |
| 7 | ප්‍රංශය | 17-සැප්-1981 | 210/17 | 17-සැප්-1982 | 1982/83 |
| 8 | පින්ලන්තය | 18-මැයි-1982 | 253/8 | 13-ජූලි-1983 | 1981/82 |
| 9 | ජර්මනිය (සංශෝධිත) | 13-සැප්-1979 | 113 | 31-ඔක්-1980 | 1982/83 |
| 10 | හොංකොං (සීමිත) | 26-මාර්තු-2004 | 1374/21 | 06-ජන-2005 | 2005/06 |
| 11 | ඉන්දියාව (සංශෝධිත) | 22-ජන-2013 | 1828/9 | 17-සැප්-2013 | 2014/15 |
| 12 | ඉන්දුනීසියාව | 03-පෙබ-1993 | 789/10 | 21-ඔක්-1993 | 1995/96 |
| 13 | ඉරානය | 25-ජූලි-2000 | 1187/16 | 06-ජූනි-2001 | 2002/03 |
| 14 | ඉතාලිය | 28-මාර්තු-1984 | 322/4 | 05-නොවැ-1984 | 1978/79 |
| 15 | ජපානය | 12-දෙසැ-1967 | 14803/5 | 29-මැයි-1968 | 1969/70 |
| 16 | කොරියාව | 28-මැයි-1984 | 342/11 | 29-මාර්තු-1985 | 1980/81 |
| 17 | කුවේටය | 05-පෙබ-2002 | 1245/19 | 18-ජූලි-2002 | 2002/03 |
| 18 | මැලයාසියාව (සංශෝධිත) | 16-සැප්-1997 | 1028/21 | 22-මැයි-1998 | 99/2000 |
| 19 | මොරිෂස් | 12-මාර්තු-1996 | 958/10 | 15-ජන-1997 | 1998/99 |
| 20 | නේපාලය | 06-ජූලි-1999 | 1116/6 | 26-ජන-2000 | 2001/02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 21 | නෙදර්ලන්තය | 17-නොවැ-1982 | 281/13 | 26-ජන-1984 | 1979/80 |
| 22 | නෝර්වේ (සංශෝධිත) | 01-දෙසැ-1986 | 464/4 | 27-ජූලි-1987 | 1989/90 |
| 23 | ඕමානය (සීමිත) | 26-ජූලි-1994 | 881/7 | 26-ජූලි-1995 | 1979/80 |
| 24 | පකිස්ථානය (සංශෝධිත) | 15-ඔක්-1981 | 210/17 | 17-සැප්-1982 | 1983/84 |
| 25 | පිලිපීනය | 11-දෙසැ-2000 | 1237/7 | 21-මැයි-2002 | 2010/11 |
| | | | 1256/27 | 02-ඔක්-2002 | |
| 26 | පෝලන්තය | 25-අප්‍රේල්-1980 | 130 | 27-පෙබ-1981 | 1984/85 |
| 27 | කටාර් | 07-නොවැ-2004 | 1422/10 | 05-දෙසැ-2005 | 2008/09 |
| 28 | රුමේනියාව | 19-ඔක්-1984 | 371/9 | 15-ඔක්-1985 | 1986/87 |
| 29 | රුසියාව | 02-මාර්තු-1999 | 1101/22 | 15-ඔක්-1999 | 2003/04 |
| 30 | සවුදි අරාබිය (සීමිත) | 16-දෙසැ-1999 | 1101/23 | 15-ඔක්-1999 | 1983/84 |
| 31 | සිංගප්පූරුව | 29-මැයි-1979 | 57/11 | 10-ඔක්-1979 | 1977/78 |
| 32 | ස්වීඩනය (සංශෝධිත) | 23-පෙබ-1983 | 297/28 | 18-මැයි-1984 | 1985/86 |
| 33 | ස්විස්ටර්ලන්තය | 11-ජන-1983 | 292/6 | 09-අප්‍රේල්-1984 | 1981/82 |
| 34 | තායිලන්තය | 14-දෙසැ-1988 | 571/16 | 18-අගෝ-1989 | 1990/91 |
| 35 | එ.අ.අමීර් රාජ්‍යය (සීමිත) | 07-ජූලි-1992 | 824/13 | 23-ජූනි-1994 | 1979/80 |
| | එ.අ.අමීර් රාජ්‍යය (පූර්ණ) | 24-සැප්-2003 | 1346/1 | 21-ජූනි-2004 | 2004/05 |
| 36 | එක්සත් රාජධානිය | 21-ජූනි-1979 | 60/23 | 02-නොවැ-1979 | 1977/78 |
| 37 | අමෙරිකා එක්සත් ජනපදය | 14-මාර්තු-1985 | 1298/8 | 22-අප්‍රේල්-1986 | 2004/05 |
| | අමෙ.එ.ජනපදය (සංධානය) | 20-සැප්-2002 | 398/4 | 21-ජූලි-2003 | |
| 38 | වියට්නාමය | 26-ඔක්-2005 | 1455/9 | 24-ජූලි-2006 | 2007/08 |
| **බහුපාර්ශවීය ගිවිසුම්** | | | | | |
| 39 | සාර්ක් බහුපාර්ශවීය ගිවිසුම් | 13- ඔක් -2005 | 1447/3 | 19-අප්‍රේල්-10 | 2011/2012 |

### 6.1.2 2013 වර්ෂය තුළ ද්විත්ව බදු ගිවිසුම්වලට අදාළ කටයුතු

**<u>ඉන්දියාව සමඟ සංශෝධිත ගිවිසුම</u>**

ශ්‍රී ලංකාවේ දී පවත්වන ලද සාකච්ඡා වලට පසුව නිල මට්ටමෙන් අත්සන් කිරීමෙන් අනතුරුව ගිවිසුමට රාජ්‍ය මට්ටමින් ජනවාරි මාසයේ දී අත්සන් තබන ලද අතර, එය 2013 ඔක්තෝබර් මස 23 වන දින ගැසට් පත්‍රයේ පළකරන ලදි.

**<u>පලස්තීනය සමඟ ගිවිසුම</u>**

සම්මුති සාකච්ඡාවලට අනතුරුව 2012 වසරේ දී කොළඹ දී රාජ්‍ය මට්ටමින් අත්සන් තබන ලද ගිවිසුම 2013 නොවැම්බර් මස 26 වන දින ගැසට් පත්‍රයේ පළකරන ලදි.

**<u>බෙලරුස් සමඟ ගිවිසුම</u>**

සාකච්ඡා 2013 අගෝස්තු 05 සහ 09 කාලය තුළ බෙලාරුස් රාජ්‍යයේ 'මින්ස්ක්' (Minsk) හිදී පැවති අතර, ගිවිසුමේ අන්තර්ගතය සඳහා කෙටි අත්සන් යෙදීම නිල මට්ටමින් අවසන් විය. ඒ සඳහා, 2013 අගෝස්තු 15 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදුව 2013 අගෝස්තු 20 වන දින රාජ්‍ය මට්ටමින් එයට අත්සන් තබන ලදි. පාර්ලිමේන්තු අනුමැතිය ලබාගන්නා ලදුව 2013 නොවැම්බර් 20 වන දින ගිවිසුම ගැසට් පත්‍රයේ පළකරන ලදි.

**<u>සිංගප්පූරුව සමඟ සංශෝධිත ගිවිසුම</u>**

ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම සංශෝධනය කිරීම සඳහා සාකච්ඡා 2013 ඔක්තෝබර් 21 - 26 කාලය තුළ 'නොවෙනා' (Novena) හිදී පවත්වන ලදි. ගිවිසුම සඳහා කෙටි අත්සන් යෙදීම නිල මට්ටමින් සිදුකරන ලදි.

**<u>පෝලන්තය සමඟ සංශෝධිත ගිවිසුම</u>**

පෝලන්තය සමඟ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුමේ සංශෝධනය සම්බන්ධයෙන් සාකච්ඡා පිළිවෙලින් 2013 දෙසැම්බර් 02 දින සහ 06 වන දින 'වර්සෝ' (Warsaw) හි දී පැවති අතර ගිවිසුමේ අන්තර්ගතය සඳහා කෙටි අත්සන් යොදන ලදුව නිල මට්ටමින් අවසන් කරන ලදි. රාජ්‍ය මට්ටමින් ගිවිසුම අත්සන් කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුව ඇත.

**<u>ලක්සම්බර්ග් සමඟ ගිවිසුම</u>**

2010 වසරේ නිල මට්ටමින් සාකච්ඡා කරන ලදුව කෙටි අත්සන් යොදන ලද ගිවිසුම 2013 ජනවාරි 31 දින රාජ්‍ය මට්ටමින් අත්සන් තබන ලදි. එය 2013 නොවැම්බර් 26 දින ගැසට් පත්‍රයේ පළකරන ලදි.

**<u>සීෂෙල්ස් (Seychelles) සමඟ ගිවිසුම</u>**

2011 වසරේ රාජ්‍ය මට්ටමින් අත්සන් තබන ලද ගිවිසුම 2013 නොවැම්බර් මස 20 වන දින ගැසට් පත්‍රයේ පළකරන ලදි.

**<u>ඕමානය සමඟ සංශෝධිත ගිවිසුම</u>**

ශ්‍රී ලංකාව සහ ඕමානය අතර ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුමේ සංශෝධනය සඳහා සාකච්ඡා 2013 වසරේ ඔක්තෝබර් 07 – 10 කාලය තුළ දී කොළඹ දී පවත්වන ලද අතර ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අදාළ අනෙකුත් කටයුතු සම්පූර්ණ කළ යුතුව ඇත.

## 6.2 විදේශයන්හි පැවති අන්තර් ජාතික බදුකරණ කාර්යයන් සඳහා සහභාගිත්වය:

වගුව 31- අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වය

| අංකය | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩ සටහන | රට | කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| 01. | එච්.බී.ඒ. සෙනෙවිරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | පොදු රාජ්‍ය මණ්ඩලීය බලධාරීන්ගේ දෙවන සාකච්ඡාව | නේපාලය | 2013.05.22<br>2013.05.23 |
| 02. | එච්.බී.ඒ. සෙනෙවිරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම | බෙලරුස් | 2013.08.05<br>2013.08.09 |
| 03. | එච්.බී.ඒ. සෙනෙවිරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම | සිංගප්පූරුව | 2013.10.21<br>2013.10.26 |
| 04. | එච්.බී.ඒ. සෙනෙවිරත්න මහතා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම | පෝලන්තය | 2013.12.02<br>2013.12.06 |
| 05. | කේ. දහනායක මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | IFA 67 වැනි කොංග්‍රසය | ඩෙන්මාර්ක් | 2013.08.25<br>2013.08.30 |
| 06. | ආර්.එම්.ආර්.ඩබ්. මංචනායක මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | OECD - බදු ගිණුම් පිළිබඳ 18 වන වාර්ෂික රැස්වීම | පැරිසිය | 2013.09.25<br>2013.09.27 |
| 07. | පී. රෝහිණී මහත්මිය<br>කොමසාරිස් | OECD - බදු ගිණුම් පිළිබඳ 18 වන වාර්ෂික රැස්වීම | පැරිසිය | 2013.09.25<br>2013.09.27 |

| | | | | |
|---|---|---|---|---|
| 08. | ආර්.එම්.පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය කොමසාරිස් | OECD - බදු ගිණුම් පිළිබඳ 18 වන වාර්ෂික රැස්වීම | පැරිසිය | 2013.09.25 2013.09.27 |
| 09. | ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙනවිය කොමසාරිස් | IRBM – OECD බදු ප්‍රතිපත්ති විශ්ලේෂණය | මැලේසියාව | 2013.02.18 2013.02.22 |
| 10. | ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙනවිය කොමසාරිස් | ද්විත්ව බදුකරණය වැළැක්වීම සම්බන්ධ ගිවිසුම | සිංගප්පූරුව | 2013.10.21 2013.10.26 |
| 11. | ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා කොමසාරිස් | ආසියා රටවල් සඳහා වන 4 වන ඉහළ මට්ටමේබදු සම්මන්ත්‍රණය | ජපානය | 2013.04.02 2013.04.04 |
| 12. | කේ.එස්.බී.ආර්.ඩී.එස්.කරුණාරත්න මහත්මිය කොමසාරිස් | IRAS – OECD හා.සේ.බ. / එ.අ.බ. සඳහා වන කලාපීය සම්මන්ත්‍රණය | සිංගප්පූරුව | 2013.05.22 2013.05.23 |
| 13 | එච්.එම්.ජී. විජේසිංහ මහතා කොමසාරිස් | IRBM – OECD බදු ගිවිසුම් විශේෂ ගැටළු | මැලේසියාව | 2013.03.18 2013.03.22 |
| 14 | බී..ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය කොමසාරිස් | IRBM – OECD බදු ගිවිසුම් විශේෂ ගැටළු | මැලේසියාව | 2013.03.18 2013.03.22 |
| 15 | බී..ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය කොමසාරිස් | ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම | බෙලරුස් | 2013.08.05 2013.08.09 |
| 16 | බී..ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය කොමසාරිස් | ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම | සිංගප්පූරුව | 2013.10.21 2013.10.26 |
| 17 | ටී.එම්. දයානන්ද මහතා කොමසාරිස් | OECD – IBFD මූල්‍ය වෙළඳපොළේ බදුකරණය | මැලේසියාව | 2013.08.26 2013.08.30 |
| 18 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා කොමසාරිස් | පොදු රාජ්‍ය මණ්ඩලීය බලධාරීන්ගේ දෙවන රැස්වීම | නේපාලය | 2013.05.22 2013.05.23 |
| 19 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා කොමසාරිස් | ද්විත්ව බදුකරණය වැළැක්වීම සම්බන්ධ ගිවිසුම | පෝලන්තය | 2013.12.02 2013.12.06 |
| 20 | එම්.අයි.එම්. මුසාමිල් මහතා නියෝජ්‍ය කොමසාරිස් | LHDNM – OECD බදු ගිවිසුම් අදාළ කරගැනීම සහ සාකච්ඡා සඳහා හඳුන්වාදීම | මැලේසියාව | 2013.09.30 2013.10.12 |
| 21 | එච්.ඒ. ලලිතා රංජනී මෙනවිය නියෝජ්‍ය කොමසාරිස් (රා.ආ.) | IRBM – CATA අන්තර්ජාතික බදු ගනුදෙනු සම්බන්ධ වැඩමුළුව | මැලේසියාව | 2013.06.03 2013.06.21 |
| 22 | බන්දුල හපුතන්ත්‍රී මහතා නියෝජ්‍ය කොමසාරිස් (රා.ආ.) | IRBM – OECD අන්තර්ජාතික බදු වැළැක්වීම, මූලික ක්ෂයවීම් ලාභ විස්ථාපනය | මැලේසියාව | 2013.10.21 2013.10.25 |
| 23 | එච්.එස්.වයි. සොයිසා මහත්මිය තක්සේරුකරු | ද්විත්ව බදුකරණය වැළැක්වීම සම්බන්ධ ගිවිසුම | බෙලරුස් | 2013.08.05 2013.08.09 |
| 24 | එච්.එස්.වයි. සොයිසා මහත්මිය තක්සේරුකරු | ද්විත්ව බදුකරණය වැළැක්වීම සම්බන්ධ ගිවිසුම | සිංගප්පූරුව | 2013.10.21 2013.10.26 |
| 25 | එම්.සී. ගුණතිලක මෙනවිය තක්සේරුකරු | ද්විත්ව බදුකරණය වැළැක්වීම සම්බන්ධ ගිවිසුම | පෝලන්තය | 2013.12.02 2013.12.06 |
| 26 | පී.ඩී.අයි.ඩී. ජයරත්න මහත්මිය තක්සේරුකරු | ද්විත්ව බදුකරණය වැළැක්වීම සම්බන්ධ ගිවිසුම | බෙලරුස් | 2013.08.05 2013.08.09 |
| 27 | පී.ඩී.අයි.ඩී. ජයරත්න මහත්මිය තක්සේරුකරු | ද්විත්ව බදුකරණය වැළැක්වීම සම්බන්ධ ගිවිසුම | පෝලන්තය | 2013.12.02 2013.12.06 |

## පරිච්ඡේදය 7 - ව්‍යවස්ථා සම්පාදනය

### 7.1 වර්ෂය තුළ දී පහත සඳහන් ව්‍යවස්ථාවන් පනවන ලදි.

i. 2013 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

ii. 2013 අංක 06 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

iii. 2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

iv. 2013 අංක 11 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

v. 2013 අංක 19 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනත

vi. 2013 අංක 20 දරන බදු අභියාචනා කොමිෂන් සභා (සංශෝධන) පනත

### 7.2 අනුමත පුණ්‍යායතන

වර්ෂය තුළ දී මේ සඳහා අනුමැතීන් ලබා දී නොමැත.

### 7.3 ගැසට් නිවේදන

දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන අදාළ පනත් යටතේ වර්ෂය තුළ දී පහත සඳහන් ගැසට් නිවේදන නිකුත් කරන ලදි.

**වගුව 32 - 2013 වර්ෂයේ දී ප්‍රසිද්ධියට පත්කරන ලද ගැසට් නිවේදන**

| | ගැසට් අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|
| I | 1813/17 | 2013.06.06 | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 වන උප වගන්තියේ 2 වන ඡේදය ප්‍රකාරව සහ එහි කාර්යයන් සඳහා හඳුනාගන්නා ලද ගම්මානවල නම් ප්‍රසිද්ධ කරන ලදි. |
| II | 1823/05 | 2013.08.12 | සම්බන්ධිත ව්‍යවසායන් අතර, ගනුදෙනු ලාභ තක්සේරු කිරීම සඳහා අසම්බන්ධිත මිල ගණනය කිරීමේ ක්‍රම. |

### 7.4 අර්ථ නිරූපණ කමිටුව

දේශීය ආදායම් පනතේ 208 අ වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2011 වසරේ පත්කරන ලද බදු නීති පිළිබඳ අර්ථ කථනය කිරීම සඳහා වන කමිටුව (CITL) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වන අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකුගේ සභාපතිත්වයෙන් යුක්ත විය. මෙම කමිටුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පරිපාලනය කරනු ලබන පනත්වල විධිවිධාන අර්ථ නිරූපණයන්, පැහැදිලි කිරීම්, මාර්ගෝපදේශ යනාදිය නිකුත් කිරීම සඳහා බැඳී ඇත.

කවර හෝ තැනැත්තෙකුට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලිත පනතක විධිවිධානයන්හි ව්‍යාකූලතාවයක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් කමිටුවෙහි අර්ථ නිරූපණය ඉල්ලා සිටිය හැකිය. (කමිටු ලේකම්, ලේකම් අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව) අර්ථ

නිරූපණයන් සහ ක්‍රියා පටිපාටීන්ට අදාළව සමානාත්මතාවය සහතික වනු පිණිස අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපදෙස් නිකුත් කිරීම සඳහා මෙම කමිටුවට බලය පවරා ඇත. අදාළ වර්ෂය තුළ දී අර්ථ නිරූපණ 54 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදි. මෙම කමිටුව මගින් ලබා දෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර 33 වගුවෙන් දක්වා ඇත.

**වගුව 33 - 2013 වර්ෂය තුළ දී කමිටුව විසින් ලබාදෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර**

| බදු වර්ගය | ක්ෂේත්‍රය | නිකුත් කරන ලද අර්ථ නිරූපණ සංඛ්‍යාව |
|---|---|---|
| ආදායම් බදු | ආදායම් බදු බැදියාව | 03 |
| | ලාභාංශ | 01 |
| | නිදහස් කිරීම් | 08 |
| | ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී අවසරලත් අඩුකිරීම් | 03 |
| | සේවා නියුක්ත ආදායම | 02 |
| | සහනදායී අනුප්‍රමාණයන් | 08 |
| | අර්ථ නිරූපණය | 03 |
| | දණ්ඩන අඩුකිරීම හෝ අත්හැරීම | 01 |
| | | |
| එකතු කළ අගය මත බදු | එ.අ.බ. සඳහා බැදියාව | 05 |
| | ශූන්‍ය අනුප්‍රමාණික වර්ගය තුළ පවත්නා සමාගම්වල සැපයුම් | 02 |
| | හිලව් යෙදවුම් බදු | 01 |
| | ආයෝජන අරමුදල් ගිණුම | 01 |
| | | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | බද්දට යටත් පිරිවැටුම සඳහා අර්ථනිරූපණ සහ ආගණනය | 06 |
| | ජා.ගො. බද්ද සඳහා බදු බැදියාව | 02 |
| | නිදහස් කිරීම් | 01 |
| | | |
| මුද්දර බදු | නිදහස් කිරීම් | 01 |
| | කොටස් පැවරීම හෝ නිකුත් කිරීම පිළිබඳ කොටස් සහතික මත බදු බැදියාව | 03 |
| | | |
| ආර්ථික සේවා ගාස්තු | පිරිවැටුම් බද්දට යටත් බදු ආගණනය | 02 |
| | | |
| ඔට්ටු හා සූදු බදු | ඔට්ටු හා සූදු බදු සඳහා බදු බැදියාව | 01 |
| | | |
| | **එකතුව** | **54** |

# පරිච්ඡේදය 8 - අනෙකුත් කාර්යයන්

## 8.1 බදු සේවා අංශය

බදු සේවා අංශය බදු ගෙවන්නන්ට සහ මහජනතාවට පහසුවෙන් දෙපාර්තමේන්තු සේවා ලබා ගත හැකි වන පරිදි පහසුකම් සලසා ඇත. උපකාර හෝ තොරතුරු ලබා ගැනීමට පැමිණෙන්නා වූ සැම තැනැත්තෙකුටම සහයෝගය ලබාදීම පිණිස මෙම ඒකකයට නිලධාරින් යොදවා ඇත. අදාළ අණ පනත්, දෙපාර්තමේන්තු ප්‍රකාශන, ගෙවීම් පත්‍රිකා, ආකෘති පත්‍ර යනාදිය මෙම ඒකකයෙන් ලබා ගත හැකිය. සිදු විය හැකි ප්‍රමාදයන් සහ අපහසුතාවයන් මග හරවාලීම පිණිස බදු ගෙවන්නන් හඳුනා ගැනීමේ අංක (TIN) සහ තාවකාලික එකතු කළ අගය මත බදු අංක මෙම අංශය මගින් නිකුත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදි. ඒ අනුව, මෙම ඒකකය මගින් බදු ගෙවන්නන් හඳුනා ගැනීමේ අංක 7,666 ක් වර්ෂය තුළ දී නිකුත් කර ඇත. (තාවකාලික එකතු කළ අගය මත බදු අයදුම්පත් 3523 ක් අංශය විසින් නව ගොනු විවෘත කිරීම සඳහා තොරතුරු අංශය වෙත සහ බදු ගෙවන්නන් හඳුනා ගැනීමේ අංක 4,034 ක් සංස්ථාපිත අංශය වෙත ද යවා ඇත.)

තවද, බදු ගෙවන්නන් නොවන පුද්ගලයින් සඳහා නිෂ්කාශන සහතිකපත් 276 ක් නිකුත් කරනු ලැබූ අතර, බදු ගෙවන්නන්ගේ යහපත උදෙසා අත් පත්‍රිකා කිහිපයක්ම පිළියෙල කිරීමට යෙදුණි. දෙපාර්තමේන්තුවේ බිම් මහලේ ස්ථාපනය කර ඇති “One Stop Shop” වෙතින් බදු ගෙවන්නන් සඳහා බදු උපදේශක සේවා සලසනු ලබන අතර, වර්ෂය තුළ දී දැනුවත් කිරීමේ වැඩ සටහන් 33 ක් සංවිධානය කරනු ලැබිණි.

## 8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විධානයන් හා නිෂ්කාශන සහතිකපත් පිළිබඳ විස්තර මතු දැක්වේ.

වගුව 34 - දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විධානයන් හා නිෂ්කාශන සහතික

| විස්තරය | 2013 | 2012 |
|---|---|---|
| *නිකුත් කරන ලද විධාන* | | |
| • උ.වි.ගෙ. අඩු කිරීම් සම්බන්ධව සේවා යෝජකයන්ට | - | - |
| • පොළී මත රඳවා ගැනීම් බදු සම්බන්ධයෙන් බැංකුවලට | 97 | 123 |
| • නිශ්චිත ගාස්තු සම්බන්ධව | 07 | 16 |
| *නිකුත් කරන ලද නිෂ්කාශන සහතිකපත්* | | |
| • අර්ථ සාධක අරමුදල් ශේෂ මුදා ගැනීම සම්බන්ධව | 125 | 333 |
| • රට හැර යන පුද්ගලයන් සම්බන්ධයෙන් | 276 | 33 |
| *නිකුත් කරන ලද වරප්‍රසාද කාඩ්පත්* | | |
| • රන් කාඩ් පත් | 157 | 150 |
| • රිදී කාඩ් පත් | 93 | 65 |
| *මෝටර් රථ ආනයනය මත බදු සහන සඳහා නිකුත් කරන ලද සහතිකපත්* | | |
| • සහතිකපත් සංඛ්‍යාව | 129 | 233 |

## 8.3 විශ්ලේෂණාත්මක වාර්තා

මහ බැංකුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ආදී වූ විවිධ ප්‍රභවයන්ගෙන් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කරමින් දෙපාර්තමේන්තුවේ ආර්ථික පර්යේෂණ සහ ප්‍රතිපත්ති ඒකකය විසින් විවිධ ආකාරයේ පර්යේෂණ සිදු කරයි. ආර්ථික පර්යේෂණ සහ ප්‍රතිපත්ති ඒකකය විසින් වසර තුළ දී පහත සඳහන් වාර්තා පිළියෙල කරන ලදී.

1. බැංකු අංශයේ ආදායම පහළයාම සම්බන්ධ විශ්ලේෂණ වාර්තාව.
2. තෝරා ගන්නා ලද අංශ 04 ක් සඳහා ප්‍රමිතිගත ලකුණක් (Bench Mark) (කොණ්ඩා මෝස්තර ශිල්පීන්, රූපලාවන්‍යාගාර, හෝටල් අංශය, ඉදිකිරීම් කර්මාන්තය, වෙළෙඳ දැන්වීම් අංශය)
3. එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් කාර්තුමය වාර්තාව (2013.09.30, 2012.12.31, 2013.03.31 සහ 2013.06.30)
4. ආදායම් බදු මත ප්‍රදානය කරන ලද නිදහස් කිරීම්, එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සඳහා බදු සීමාව ඉහළයාම සහ ආදායම මත ස.එ.අ.බ. (SVAT) හඳුන්වාදීමේ බලපෑම සම්බන්ධයෙන් විශ්ලේෂණ වාර්තාව.
5. ආංශික වශයෙන්, කාර්යමය වශයෙන් සහ බදු වශයෙන් ආර්ථික දර්ශක සැලකිල්ලට ගනිමින් ආදායම මත විශ්ලේෂණ වාර්තාව (වාර්ෂික, කාර්තුමය, මාසික, දෛනික)
6. මාසික සහ කාර්තුමය බදු නිල ප්‍රකාශන (2013.04.30 දක්වා)

## 8.4 ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS)

දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරිව, මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලෙහි කොටසක් වශයෙන් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීමට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අවශ්‍ය විය.

ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීමෙහි ලා උපකාරී වනු පිණිස සිංගප්පූරුව හා සම්බන්ධ වීමට 2012.11.29 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත ලැබී ඇත.

මෙම කාර්යය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ සිංගප්පූරුවේ අන්තර්ජාතික Infocomm Development Authority ය අතර අවබෝධතා ගිවිසුමක් 2013.06.05 වන දින අත්සන් කරන ලදි.

**ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ අරමුණු පහත සඳහන් පරිදි හඳුනාගනු ලැබේ.**

I. බදු නීති සමඟ අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දරන ප්‍රයත්නයන් අවම කිරීම සහ ගනුදෙනු ක්‍රියාවට නැංවීමෙහි ලා බදු නිලධාරීන්ට පරිපාලනමය බර අඩුකිරීම සඳහා බදු ගෙවීමේ සේවා ස්වයං සේවාවනට පරිවර්තනය කිරීම.

II. බදු ගෙවන්නන් සඳහා බදු අනුකූලතා පිරිවැය මෙන්ම දෙපාර්තමේන්තුව සඳහා බදු පරිපාලනමය පිරිවැය අවම කිරීම.

III. දෙපාර්තමේන්තුව තුළ සහ ඉන් පරිබාහිරව පවත්නා තොරතුරු මත පදනම්ව බදු හරහා බදු ගෙවන්නාගේ තොරතුරු සහ බදු බැඳියාවන් සම්බන්ධයෙන් ඒකාබද්ධ මතයක් ස්ථාපනය කිරීම.

IV. පරිගණක සහ අන්තර්ජාලය වෙත ප්‍රවේශ වීමේ හැකියාව සහිතව හෝ රහිතව බදු ගෙවන්නන් සියලු කොටස්වලට ලබාදීම සඳහා සේවා බෙදාහැරීමේ මාර්ග ක්‍රියාත්මක කිරීම.

V. මධ්‍යගත බදු ගෙවන්නන්ගේ දත්ත සමුදායක් (දත්ත පද්ධතියක්) ඇති කිරීම සහ පුද්ගල සහ සංස්ථාපිත බදු ගෙවන්නන් යන දෙපාර්ශ්වය සඳහා අනන්‍ය හඳුනාගැනීමේ අංකයක් ක්‍රියාවට නැංවීම.

VI. මෙහෙයුම් කාර්යක්ෂමතා, ආදායම් රැස්කිරීම සහ අනුකූලතා අධීක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, බැංකු, රේගු දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ පද්ධති (විශේෂ උනන්දුවක් දක්වන්නන්) අතර තොරතුරු හුවමාරු පහසුකම් සැලසීම පිණිස ඒකාබද්ධ ක්‍රමයක් ස්ථාපනය කිරීම.

VII. බදු ගෙවන්නන්ට අදාළව බාහිර ගනුදෙනු දත්ත මූලාශ්‍ර විශ්ලේෂණය කිරීමෙන් බදු අනුකූලතාවය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම තුළින් බදු ආදායම වැඩි කිරීම.

අවශ්‍ය පියවර සාකච්ඡා කිරීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පත්කරන ලද කොමසාරිස්වරුන් පස් දෙනෙකුගෙන් (05) සහ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සිංගප්පූරුවේ අන්තර්ජාතික Infocomm Development Authority හි නියෝජිතයන් සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නිලධාරීන් හමු විය.

සිංගප්පූරුවේ අන්තර්ජාතික Infocomm Development Authority විසින් 2013 අගෝස්තු මස තම සවිස්තර යෝජනාව ඉදිරිපත් කරන ලදි. යෝජනාව ඇගයීම සහ කොන්දේසි සම්බන්ධයෙන් සම්මුතියකට එළැඹීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡා කමිටුවක් පත්කරන ලදි.

දැනට ක්‍රියාත්මක වැඩසටහන් ඇගයීම සඳහා ආදායම් නිලධාරීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් 2013 නොවැම්බර් මස සිංගප්පූරුවේ සංචාරය කළ අතර, වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

## 2013.12.31 දිනට තක්සේරු අංශ අතර කාර්ය මණ්ඩලය ලිපිගොනු හා ආදායම් බෙදී යාම

Annexure

| තක්සේරු අංශය | කාර්ය මණ්ඩලය | | | | | | | ලිපිගොනු | | | | | | | | ආදායම (රු.මිලියන) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නි.කො. | ජ්‍යෙ.ත. | තක්. | ජ්‍යෙ.බ.නි. | බ.නි. | වෙනත් | එකතුව | ආ.බ./ ර.ගැ.බ | නි.වා | එ.අ.බ./ වි.එ.අ.බ. | ජා.ගො.බ. | උ.වි.ගෙ. | ආ.සේ.ගා. | ඔ.සු./මු.බ. | රා.නො.සං. | ආ.බ./ස.ව.බ./ර. ගැ.බ. | උ.වි.ගෙ. | ආ.සේ.ගා. | එ.අ.බ./ හා.සේ.බ. | ජා.ගො.බ. | පි.බ./ ඔ.සු.බ. | හ.බ./ කො.ග.බ. | මු.බ./ඉ.බ. | එකතුව |
| ජාත්‍යන්තර අංශය (5 බී) | 1 | - | 6 | 3 | - | 4 | 14 | - | 555 | 81 | 30 | 67 | 21 | - | 179 | 4,126.74 | 380.68 | 103.09 | 515.18 | 66.48 | - | - | - | 5,192.17 |
| 1 හා 2 අංශය | 1 | - | 7 | 7 | - | 6 | 21 | 3,762 | - | - | - | - | 14 | - | - | 760.40 | - | 0.37 | 18.62 | 10.97 | - | - | - | 790.36 |
| 3 අංශය | 1 | 1 | 8 | 9 | - | 9 | 28 | - | - | - | - | - | - | - | - | 19.30 | - | - | - | - | - | - | - | 19.30 |
| 4 අංශය | 1 | 2 | 5 | 5 | - | 9 | 22 | 1,064 | - | 777 | 612 | 818 | 168 | - | - | 635.81 | 231.44 | 124.41 | 1,343.77 | 520.86 | 0.23 | - | - | 2,856.52 |
| 4 ඒ අංශය (4 නව) | 1 | 4 | 8 | 6 | - | 8 | 27 | 5,378 | - | 926 | 2,518 | 1,664 | 14 | - | - | 592.01 | 191.78 | 79.06 | 998.72 | 395.05 | 0.82 | - | - | 2,257.45 |
| 5 අංශය | 1 | 2 | 5 | 6 | - | 7 | 21 | 862 | - | 624 | 593 | 653 | 87 | - | - | 754.98 | 412.79 | 221.03 | 1,286.83 | 463.93 | - | - | - | 3,139.55 |
| 5 සී අංශය | 1 | 2 | 9 | 6 | - | 6 | 24 | 4,376 | - | 1,035 | 548 | 1,281 | 39 | - | - | 698.65 | 251.71 | 127.40 | 927.97 | 499.70 | 0.57 | - | - | 2,505.99 |
| 17 අංශය | 1 | - | 8 | 8 | - | 8 | 25 | 7,952 | - | 812 | 585 | 636 | 72 | - | - | 441.82 | 320.08 | 41.04 | 1,170.82 | 469.14 | - | - | - | 2,442.89 |
| 12 අංශය (5 ඒ) | 1 | 1 | 7 | 8 | - | 5 | 22 | 902 | 7 | 888 | 482 | 764 | 767 | - | 1 | 1,471.04 | 350.71 | 187.09 | 1,374.61 | 408.38 | 0.22 | - | - | 3,792.05 |
| 5 ඩී අංශය | 1 | 1 | 8 | 7 | - | 4 | 21 | 3,919 | - | 903 | 522 | 667 | 70 | - | - | 510.50 | 176.53 | 117.36 | 927.47 | 324.65 | (0.40) | - | - | 2,056.12 |
| 14 හා 15 අංශය | 2 | 1 | 11 | 9 | - | 10 | 33 | 9,180 | - | 2,682 | 1,855 | 2,002 | 1,114 | - | - | 1,085.12 | 185.57 | 220.24 | 2,470.61 | 1,407.27 | 0.12 | - | - | 5,368.92 |
| සංස්ථාපිත බදු විශේෂ විගණන අංශය | 1 | 1 | 7 | 8 | - | 7 | 24 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 10 අංශය | 2 | 2 | 12 | 12 | - | 5 | 33 | 634 | - | 431 | 367 | 469 | 379 | - | - | 5,875.60 | 2,352.95 | 1,017.43 | 10,687.45 | 3,604.54 | 0.13 | - | - | 23,538.08 |
| 6 ඒ අංශය | 1 | 2 | 8 | 11 | - | 7 | 29 | 411 | 3 | 403 | 389 | 341 | 33 | - | - | 7,469.15 | 1,652.01 | 611.01 | 10,751.56 | 4,863.58 | 0.31 | - | - | 25,347.62 |
| 6 බී අංශය | 2 | - | 12 | 13 | - | 9 | 36 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 6 සී අංශය | 2 | 1 | 13 | 10 | - | 9 | 35 | 164 | 7 | 279 | 85 | 138 | 94 | - | - | 34,559.82 | 3,707.79 | 190.71 | 30,464.39 | 1,706.51 | 0.31 | 0.47 | - | 70,630.00 |
| 7 ඒ අංශය | 2 | 2 | 10 | 11 | - | 8 | 33 | 464 | 3 | 400 | 412 | 416 | 271 | - | - | 13,186.78 | 3,692.81 | 1,434.28 | 15,902.81 | 8,808.70 | 1.85 | - | - | 43,027.24 |
| 7 බී අංශය | 2 | 2 | 11 | 10 | - | 7 | 32 | 423 | - | 394 | 361 | 350 | 89 | - | - | 8,396.99 | 1,447.27 | 573.75 | 18,670.61 | 4,100.15 | 4.26 | - | - | 33,193.03 |
| 8 අංශය | 2 | 1 | 11 | 13 | - | 6 | 33 | 428 | 8 | 445 | 350 | 399 | 431 | - | - | 13,049.17 | 2,604.79 | 944.73 | 19,128.05 | 2,874.95 | 0.03 | - | - | 38,601.73 |
| රඳවා ගැනීමේ බදු (නිශ්චිත ගාස්තු මත) | 1 | - | 3 | 6 | - | 6 | 16 | 84 | - | - | - | - | - | - | - | 1,007.03 | - | - | - | - | - | - | - | 1,007.03 |
| රඳවා ගැනීමේ බදු (පොලී මත) | 1 | - | 7 | 4 | - | 5 | 17 | 2,517 | - | - | - | - | - | - | - | 77,694.70 | - | - | - | - | - | - | - | 77,694.70 |
| උපයන විට ගෙවීම් අංශය | 1 | - | 5 | 3 | - | 7 | 16 | - | - | - | - | 1,113 | - | - | - | 1,233.11 | 63.62 | - | - | - | - | 1,197.41 | - | 2,494.15 |
| ආ.සේ.ගා., ජා.ගො.බ., ඔට්ටු හා සූදු බදු අංශය | 1 | 1 | 5 | 5 | - | 5 | 17 | - | - | - | - | - | - | 1,072 | - | - | - | - | - | - | 592.77 | - | - | 592.77 |
| එ.අ.බ. (විශේෂ විගණන) අංශය | 1 | 1 | 10 | 11 | - | 6 | 29 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| එ.අ.බ. ආපසු ගෙවීම් අංශය | 4 | 2 | 15 | 16 | - | 13 | 50 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| එ.අ.බ. ලියාපදිංචි අංශය | 1 | - | 4 | 2 | - | 9 | 16 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| එ.අ.බ. විගණන අංශය | 2 | - | 14 | 13 | - | 4 | 33 | - | - | 3,941 | - | - | - | - | - | - | - | - | 3,453.83 | - | - | - | - | 3,453.83 |
| ස.එ.බ. විගණන අංශය | 1 | - | 9 | 6 | - | 4 | 20 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ස.එ.බ. අධීක්ෂණ අංශය | 1 | - | 3 | 1 | - | 1 | 6 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මුද්දර බදු අංශය | 1 | - | 8 | 10 | - | 8 | 27 | - | - | - | - | - | - | 7,648 | - | - | - | - | - | - | - | - | 6,981.06 | 6,981.06 |
| **ප්‍රාදේශීය කාර්යාල** | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| කොළඹ දකුණ | 1 | 1 | 14 | 9 | - | 12 | 37 | 10,043 | - | - | 366 | - | 63 | - | - | 822.01 | - | 13.11 | 0.47 | 165.97 | - | - | - | 1,001.56 |
| කොළඹ මැද | 1 | 2 | 12 | 8 | - | 13 | 36 | 12,296 | - | - | 714 | - | 7 | - | - | 746.40 | - | 28.72 | 0.64 | 387.95 | - | - | - | 1,163.71 |
| කොළඹ නගර | 1 | 1 | 13 | 10 | - | 19 | 44 | 10,500 | - | 32 | 874 | - | 205 | - | 27 | 718.52 | - | 23.86 | 0.23 | 430.38 | - | - | - | 1,172.99 |
| මහරගම නැගෙනහිර | 1 | - | 6 | 9 | - | 13 | 29 | 10,819 | - | - | 623 | - | 1 | - | - | 237.36 | - | 27.93 | 0.69 | 236.17 | 0.17 | - | - | 502.32 |
| මහරගම බටහිර | 1 | 1 | 9 | 10 | - | 13 | 34 | 15,661 | - | 77 | 654 | - | 2 | - | - | 357.20 | - | 11.10 | 0.76 | 228.98 | - | - | - | 598.04 |
| බදුල්ල | 1 | 1 | 6 | 7 | - | 14 | 29 | 5,773 | - | - | 426 | - | 3 | - | - | 161.73 | - | 5.86 | 1.78 | 152.39 | - | - | - | 321.77 |
| ගාල්ල | 1 | 1 | 8 | 10 | - | 18 | 38 | 7,538 | - | - | 429 | - | 4 | - | - | 179.06 | - | 11.99 | 2.78 | 159.79 | - | - | - | 353.63 |
| කළුතර | 1 | - | 10 | 10 | - | 21 | 42 | 8,013 | - | 55 | 459 | - | 158 | - | - | 134.79 | - | 9.52 | 0.60 | 169.98 | 0.79 | - | - | 315.68 |
| මාතර | 1 | 1 | 13 | 8 | - | 21 | 44 | 9,095 | - | - | 332 | - | - | - | - | 188.01 | - | 10.08 | 1.30 | 177.43 | - | - | - | 376.82 |
| නුවරඑළිය | 1 | 1 | 8 | 6 | - | 13 | 29 | 3,703 | - | - | 389 | - | 26 | - | 10 | 141.10 | - | 1.53 | 0.96 | 118.23 | - | - | - | 261.83 |
| රත්නපුරය | 1 | 1 | 9 | 9 | - | 15 | 35 | 7,451 | - | 3 | 456 | - | 4 | - | 1 | 225.39 | - | 14.51 | 0.63 | 178.29 | - | - | - | 418.83 |
| අනුරාධපුරය | 1 | 1 | 6 | 9 | - | 19 | 36 | 4,648 | - | - | 607 | - | - | - | - | 208.55 | - | 13.71 | 1.92 | 162.75 | - | - | - | 386.94 |
| ගම්පහ | 1 | 2 | 13 | 9 | - | 12 | 37 | 13,605 | - | - | 835 | - | - | - | - | 263.36 | - | 24.38 | 0.52 | 490.84 | - | - | - | 779.09 |
| මඩකලපුව | 1 | - | 2 | 9 | - | 11 | 23 | 4,704 | - | 74 | 346 | - | 29 | - | - | 72.00 | - | 12.56 | 3.86 | 98.83 | 0.09 | - | - | 187.33 |
| යාපනය | 1 | - | - | 1 | 1 | 11 | 14 | 2,178 | - | - | 359 | - | 1 | - | - | 77.69 | - | 1.93 | 2.84 | 120.80 | - | - | - | 203.26 |
| මහනුවර | 1 | 1 | 16 | 19 | - | 19 | 56 | 11,467 | - | - | 619 | - | 180 | - | - | 414.28 | - | 14.60 | 2.56 | 263.89 | 1.49 | - | - | 696.81 |
| කෑගල්ල | 1 | 1 | 9 | 8 | - | 15 | 34 | 5,612 | - | - | 218 | - | 5 | - | - | 97.99 | - | 11.15 | 0.44 | 86.72 | - | - | - | 196.30 |
| කුරුණෑගල | 1 | 1 | 16 | 15 | - | 20 | 53 | 12,816 | - | 153 | 1,046 | - | 46 | - | - | 220.44 | - | 21.77 | 0.64 | 215.91 | - | - | - | 458.76 |
| දඹුල්ල | 1 | 2 | 10 | 9 | - | 16 | 38 | 7,557 | - | 49 | 320 | - | 38 | - | - | 133.40 | - | 15.74 | 0.62 | 130.84 | - | - | - | 280.61 |
| මීගමුව | 1 | 1 | 8 | 8 | - | 13 | 31 | 12,285 | - | 56 | 699 | - | 126 | - | - | 240.89 | - | 11.84 | 0.53 | 203.37 | - | - | - | 456.63 |
| එකතුව | **61** | **48** | **437** | **422** | **1** | **510** | **1,479** | **218,284** | **583** | **15,520** | **20,480** | **11,778** | **4,561** | **8,720** | **218** | **179,208.91** | **18,022.54** | **6,278.89** | **120,118.06** | **34,704.38** | **603.75** | **1,197.88** | **6,981.06** | **367,115.46** |

| | |
|---|---|
| **ආනයන මත එ.අ.බ.** | **96,590.09** |
| **ආනයන මත ජා.ගො.බ.** | **22,443.44** |
| **භාණ්ඩාගාර පැවරුම්** | **4,564.36** |
| **ආපසු ගෙවීම්** | **(1,060.34)** |
| **ගැලපුම්, වර්ගීකරණය නොකළ ආදායම, අගරු චෙක්පත් සහ අනෙකුත්** | **2,886.41** |
| **ශුද්ධ රැස්කිරීම් (පළාත් සභා වලට මාරු කරන ලද මුද්දර බදු සහ ජා.ගො.බ. ප්‍රමාණයෙන් 1/3 ක් ද ඇතුළත් ය.)** | **492,539.43** |